**දකුණු පළාත් සභාව - 2014**

දකුණු පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිසඅවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ටමම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම්තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 . මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2015 අප්‍රේල් 15 දින විගණනයට ඉදිරිපත් කරන ලදී. 2014 දෙසැම්බර් 31 දිනට පළාත් සභා සමුච්චිත අරමුදල රු.742,171,657ක් වූ අතර එය 2013 දෙසැම්බර් 31 දිනට රු.26,759,195 ක්විය. 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී පළාත් සභා අරමුදල රු.715,412,462 කින් වර්ධනය වී තිබුණි.

### 2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2015 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම්සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 26 | 20 | 06 |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (iii) | පළාත් රාජ්‍ය නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 92 | 72 | 20 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 11 | 02 | 09 |
| (v) | අරමුදල් ගිණුම් | 06 | 03 | 03 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | - | 05 |
| | එකතුව | 141 | 98 | 43 |

### 2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව වර්ෂයේ අතිරික්තය රු.741,086,680 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු.715,412,462 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව රු.25,674,218 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) කෙටිකාලීන ආයෝජන යටතේ දක්වා ඇති ස්ථාවර තැන්පතු ආරම්භක ශේෂය, අරමුදල් ගිණුම අනුව රු.102,528,712 ක් වුවත් ප්‍රධාන ලෙජරය අනුව එම ශේෂය රු.103,142,305 ක් විය. ඒ අනුව අරමුදල් ගිණුම හා ලෙජරය අතර රු.613,593ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ධීවර,සංස්කෘතික, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

(i) ගිංගහ ඉවුර සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා කුඹුක් පැල 1500 ක් සිටුවීම හා නඩත්තුව වෙනුවෙන් ඇස්තමේන්තුවක් මත රු.100,000 ක් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2014 දෙසැම්බර් 22 දින ගෙවා තිබුණි. මෙය අත්තිකාරමක් වුවද අවසාන ගෙවීමක් ලෙස වැය විෂයය 311-03-02-2005(02) ට හර කර තිබුණි.

(ii) අමාත්‍යාංශය මගින් තලපත්කන්ද ජල උල්පත ආශ්‍රිතව පානීය ජල ව්‍යාපෘතියක් වෙනුවෙන් 2014 ඔක්තෝබර් 29 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙත ගෙවන ලද රු.3,728,000 ක මුදල අත්තිකාරම් ලෙස ගිණුම් ගත නොකර වැය විෂයය 311-03-02-2005(02)ට හර කර තිබුණි.

(ඇ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1995 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා ස්ථාන මාරු වී පැමිණි ගුරුවරුන් 79 දෙනෙකුට අදාල වූ රු.1,021,396 ක ණය ශේෂයෙන් රු.972,739 ක වටිනාකමින් යුතු ණයහිමියන් 75 දෙනෙකුගේ උපලේඛනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ නමුත් අදාල ණය ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතන 03 කට අදාල වර්ෂ 02 කට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම පිළිවෙලින් රු.23,308,988 ක් හා රු.909,125 ක් විය.

(ආ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද නව ප්‍රභේද තේ පැල තවාන් ව්‍යාපෘතිය මගින් එක් තවාන්කරුවෙකු වෙත ලබාදී තිබුණු අත්තිකාරම් මුදලින් නැවත නොපියවූ රු.8,584,507 ක් ද ඊට අදාල රු.5,687,260 ක් වූ පොලිය හා රු.5,930,442ක් වූ දෙපාර්තමේන්තු ගාස්තු ඇතුළුව රු.20,202,209 ක මුදලක් 2014 වර්ෂය ආරම්භය වන විට ලැබිය යුතුව තිබුණි. අධිකාරිය විසින් එම මුදල අයකර ගැනීමට කටයුතු නොකර කිසිඳු විධිමත් අනුමැතියක් රහිතව ඔහුට අයත් අක්කර 1 යි පර්චස් 25 ක් වූ ඉඩමක් රු.7,026,250කට පවරාගෙන තිබුණි. මෙම ඉඩම 1998 දෙසැම්බර් 02 දින රු.17,500 කටත් 2001 පෙබරවාරි 25දිනරු.50,000 කටත් හුවමාරු වී තිබූ අතර 2009 මාර්තු 24 දින තවාන්කරු විසින් මෙම ඉඩම රු.300,000 කට මිලට ගෙන 2013 මාර්තු 03 දින රු.350,000 කට විකුණා තිබුණි. එම ගැනුම්කරුවෙත 2014 ඔක්තෝබර් 24 දින අධිකාරිය විසින් රු.600,000 ක් ගෙවා ඉඩම අධිකාරියට පවරා නොගෙන ඒ වෙනුවට තවාන්කරු වෙත පවරාදීමට කටයුතු කර තිබුණි. ඊට දින 19 කට පසුව රජයේ තක්සේරුකරුගේ තක්සේරු වාර්තාවක් රහිතව දකුණු පළාත් ආදායම් කොමසාරිස්ගේ තක්සේරුවක් මත රු.7,076,250 කට අධිකාරිය විසින් පවරාගෙන තිබුණු බවත් ඒ අනුව ඉඩම සඳහා අධිකාරිය රු.7,676,250 ක් ගෙවා තිබුණු බව විගණනයේදී වැඩිදුරටත් අනාවරණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතන 05 කට අදාල එකතුව රු.37,907,116 ක් වූ ගනුදෙනු සම්බන්ධයෙන් වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ආ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

(i) 2015 ජනවාරි 02 දිනැති අංක SN/GL/B/SPRDA/තොරතුරු/2014/01(ii)දරන ලිපිය මගින් පහත දක්වන ලද සිද්ධි පිළිබඳ ඉල්ලුම් කරන ලද තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරිණි.

- අංක 52-8688 දරන කැබ්රථය අනතුරට පත්වීම
- අළුත්වැව අංගනයේ ද්‍රව්‍ය තොග අඩුවීම
- ඇඟිලි සළකුණු යන්ත්‍රයට සම්බන්ධ පරිගණකයේ වේලාව වෙනස් කිරීම
- 2010 සැප්තැම්බර් 18 සෙනසුරාදා දින අතිකාල සේවය සඳහා කාර්යාලය විවෘත කිරීම

- ➢ වැලිගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලීය අංගනයේ තිබූ තාර බැරල් 03ක් අස්ථානගත වීම

- ➢ වැලිගත්ත බුන්දල මාර්ගයේ පළමු කිලෝමීටරයේ පැතිබැම්ම හා සපත්තු පාලම ඉදිකිරීමේදි වැඩිපුර මුදල් ගෙවීම

(ii) 2015 මාර්තු 31 දිනැති අංක SN/GL/B/ද.ප.මා.සං.අ./තොරතුරු/2014/01(iv) හා (vi) දරන ලිපි මගින් ඉල්ලුම්කරන ලද 2014 වර්ෂය තුළඑකතුකළ අගය මත බදු ගෙවීම් පිළිබඳ තොරතුරු හා වාහන උපයෝජනය සම්බන්ධයෙන් වූ තොරතුරු විගණනයටඉදිරිපත් නොකෙරිණි.

(iii) 2015 ජුනි 05 දිනැති අංක SN/GL/B/ද.ප.මා.සං.අ./තොරතුරු/2014/01(v) දරන ලිපිය මගින් ඉල්ලුම්කරන ලද කාර්ය මණ්ඩල තොරතුරුපිළිබඳ සම්පූර්ණ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ඇ) දකුණු පළාත් සභාවේ 2000 අංක 01 දරන රුහුණු සංචාරක කාර්යාංශ ප්‍රඥප්තියේ 9(3) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය සඳහාපත් කරනු ලබන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනාගේ දැනුම හා පළපුරුද්ද සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ඈ) විගණිත දිනය වූ 2015 පෙබරවාරි 11 වනවිට මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 6 ක් වසා තිබූ අතර ඒ සඳහා අනුමැතිය හා බඩු බාහිරාදිය භාරදීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

### 2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1996 අංක 01 දරන දකුණු පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය | | |
| | 17 වගන්තිය | | එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් හා විගණනය කරන ලද ගිණුම් සමඟ විගණකාධිපතිවරයාගේ වාර්තාව පළාත් සභාවේ සභාගත කළ යුතු වුවත් අරමුදලේ ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2000 අංක 01 දරන රුහුණු සංචාරක කාර්යාංශ ප්‍රඥප්තියේ ii වන කොටසේ 9(i) වගන්තිය | | නිල සාමාජිකයින් දෙදෙනෙකු හා නම් කරනු ලබන එක් සමාජිකයකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර නොතිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය
---------------------

| | | | |
|---|---|---|---|
| (i) | ii පරිච්ඡේදයේ 13.3 වගන්තිය | | රුහුණු සංචාරක කාර්යාංශය පිහිටුවා වසර 10 ක් ඉක්මවා තිබුණද කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර නොමැති වීමෙන් කළමනාකරණ අධ්‍යක්ෂ තනතුර සඳහා දිගින් දිගටම වැඩබැලීමේ පදනම මත පත්කිරීම් සිදුකර තිබුණි. |
| (ii) | iv පරිච්ඡේදයේ 5.1 වගන්තිය | | රුහුණු සංචාරක කාර්යාංශයට 2007 වර්ෂයේ සිට බඳවාගත් සේවකයින් 17 දෙනෙකු ස්ථිර කර නොතිබුණි. |
| (iii) | vii පරිච්ඡේදයේ 12.7 වගන්තිය හා 2008 ජුනි 28 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 23,540 | වැඩබැලීමේ තනතුරක් දරන නිලධාරියෙකු වැඩබැලීමේ තනතුරට හිමි ඉන්ධන දීමනාව ලබා ගැනීම සඳහා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එලෙස අනුමැතිය ලබාගැනීමකින් තොරව දකුණු පළාත් ඉඩම් කොමසාරිස් තනතුරේ වැඩ බලන ලද නිලධාරියාට රු.23,540 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි. |
| (iv) | xix පරිච්ඡේදයේ 6.1 වගන්තිය | | යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියලුම නිවාසවල බදු කාලය වර්ෂ 5 ක් වුවද, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් නිල නිවාසයේ පදිංචිව සිටින බව විගණනයේදී අනාවරණය විය. |
| (v) | xxiv පරිච්ඡේදයේ 4.4, 4.5, 4.6 වගන්ති | | මියගිය, සේවය අතහැරගිය, වැඩ තහනමට ලක්වූ නිලධාරින්ගෙන් අයවිය යුතු ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. දකුණු පළාත් සභාව තුළ වූ ආයතන 18 ක එසේ අයකර නොගත් ණය මුදල රු.7,660,877 ක් විය. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි
------------------------

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 371 | 420,000 | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම සම්බන්ධයෙන් රු.20,000 ක සහ මන්ත්‍රී ප්‍රතිපාදන ගිණුම සම්බන්ධයෙන් රු.400,000ක අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 396(ඈ) | 1,879,500 | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ බැංකු ගිණුම් 03කට අදාල මාස 06 ක් ඉක්මවූ රු.27,750ක් වටිනා චෙක්පත් 03ක්ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මාස 06 ඉක්මවූ චෙක්පත් 285කට අදාලඑකතුවරු.1,851,750ක් ගණකාධිකාරිවරයාගේ උපදෙස් මත 2014 දෙසැම්බර් 31 දින තැන්පත් ගිණුමට බැර කර තිබූ අතර 2015 ජූලි 21 වන විටත් එම චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 485(4) | නිලධාරියෙකු එක් දෙපාර්තමේන්තුවක සිට තවත් දෙපාර්තමේන්තුවකට මාරුකළ විට ඔහුගෙන් තවදුරටත් අයවිය යුතු ණය ශේෂය පසුව කී දෙපාර්තමේන්තුවෙන් කලින් කී දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වුවත් දකුණු පළාත තුළ වු ආයතන 20 ක රු.156,674,767 ක් වු ණයගැති හා ණයහිමි ශේෂ එසේ පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 කට වඩා පැරණි තැන්පත් මුදල් ආදායමට ගත යුතු වුවත් දකුණු පළාත තුළ වු ආයතන 06 ක රු.82,060,143 ක් වු වර්ෂ දෙකක් ඉක්ම වු තැන්පත් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 1646 | මාසික ධාවන සටහන්වල මුල් පිටපත් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත එවිය යුතු වුවත් දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් අමාත්‍යාංශයට අයත් වාහන 08 කට අදාල 2014 වර්ෂයේ මාස 96 ක් වෙනුවෙන් වු දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත එවා නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 1647(ආ) | වාහන වාර්ෂිකව භෞතිකව සමීක්ෂණය කළ යුතු වුවදදකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | දකුණු පළාත් සහා මුදල් රීතිසංග්‍රහය<br>--------------------- | |
| (i) | මුදල් රීති 54.4, 54.5, 54.6 | ➢ වාහන අනතුරු පිළිබඳ ප්‍රාරම්භක වාර්තා හා අවසාන වාර්තා විගණකාධිපති වෙත එවිය යුතු වුවත් දකුණු පළාත තුළ වු ආයතන 06 ක වාහන 20කට සිදු වු අනතුරු 22 ක් පිළිබඳව ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br><br>➢ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2014 විසර්ජන ගිණුමේ දක්වා ඇති රු.18,388,006 ක් වු අලාභහානි 124 ක් පිළිබඳව පරික්ෂණ නිම කර අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ ක්‍රියාකර නොතිබුණි. |
| (ii) | මුදල් රීති 113 (1) හා (3) | ලැබෙන සියළුම මුදල් සඳහා නිල ලදුපතක් නිකුත් කළ යුතු වුවත් පහත අවස්ථාවලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br><br>➢ ගාල්ල දිස්ත්‍රික්කයේ මහාවිද්‍යාලයක ප්‍රාථමික අංශයේ සිසුන් 10 දෙනෙකුගෙන් අයකළ රු.6,000 ක් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණු අතර ඒවා ආදායමටද ගෙන නොතිබුණි.<br><br>➢ මාතර දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාලයක 2014 වර්ෂයේ 6 වසර සඳහා සිසුන් 150 ක් බඳවා ගැනීමේදී පරිත්‍යාග ලෙස ලබාගත් රු.90,000 ක් හා |

| | | | |
|---|---|---|---|
| | | | විදුලිය සඳහා ලබාගත් රු.150,000 ක් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. |
| (iii) | මුදල් රීති 169(1) හා 177 | 143,375 | ගෙවීමට ප්‍රථම සෑම වවුචරයක්ම විධිමත් පරිදි සහතික කළ යුතු වුවත් ගාල්ල දිස්ත්‍රික්කයේ බාලිකා විද්‍යාලයක රු.143,375 ක් වූ ගෙවීම් වවුචර් 06 ක් සඳහා වියදම් සහතික නොකර ගෙවීම් කර තිබුණි. |
| (iv) | මුදල් රීති 261.2.1 | 82,591 | රු.10,000 ක උපරිමය ඉක්මවා සුළු මුදල් අග්‍රිමයක් අවශ්‍යයයි සැලකෙන අවස්ථාවලදී ඒ සඳහා පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ සිදු නොකර පෞද්ගලික මුදලින් රු.82,591 ක් දක්වා විවිධ බිල්පත් සඳහා ගෙවීම් සිදු කර දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාල සුළු මුදල් අග්‍රිමය මගින් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (v) | මුදල් රීති 261.2.7 | | මාතර කලාප අධ්‍යාපන කාර්යාලයේ 2014 වර්ෂයේ නිලධාරින් 06 දෙනෙකුට දෙනලද මුළු එකතුවරු.127,800 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිම, අදාළ කාර්යය නිමවී පියවීම සඳහා මාස 1 1/2 සිට 5 දක්වා කාලයක් ගතකර තිබුණි. |
| (vi) | මුදල් රීති276 | 492,000 | ලියන ලද චෙක්පත් අදාල ආදායකයා වෙත භාර දිය යුතු වුවත් විවිධ ගෙවීම් සඳහා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින ලියන ලද රු. 492,000 ක වටිනාකමින් යුතු චෙක්පත් 10 ක් විගණිත දිනය වූ 2015 පෙබරවාරි 10 වන විටත් අදාල ආදායකයන් වෙත භාර නොදී අත රඳවා ගෙන තිබුණි. |
| (vii) | මුදල් රීති 471.1 | 415,625 | දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් " දක්ෂිණ ජීවනි " තරඟාවලියේ ජයග්‍රාහකයන්ට ලබාදීම සඳහා මිලදී ගෙන තිබුණු ශබ්දකෝෂ 475 ක් සඳහා 2015 මැයි 26 දින රු.415,625 ක් ගෙවා ඇතත්, ඒවා බඩු වට්ටෝරු පොතට ඇතුළත් කර නොතිබුණි. |
| **(ඊ)** | ජනාධිපති ලේකම් චක්‍රලේඛ<br>---------------------- | | |
| (i) | 2007 පෙබරවාරි 28 දිනැති අංක CSA/P/1/40 දරන චක්‍රලේඛය | | "රාජ්‍ය ආයතන සිය රැස්වීම් , සම්මන්ත්‍රණ, වැඩ මුළු ආදිය පැවැත්වීම සඳහා හෝටල් තෝරා නොගතයුතු අතර දේශීය සංචාරවලදී ආහාර පාන හා නවාතැන් වෙනුවෙන් ගෙවිය යුතු හෝටල් ගාස්තු රජයේ මුදලින් නිරවුල් නොකළ යුතුය" යනුවෙන් දක්වා ඇතත් පහත අවස්ථාවලදී ඊට පටහැනිව කටයුතු කර තිබුණි.<br>➢ දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ වැඩමුළු තුනක් සඳහා රු.597,295ක් හා ප්‍රවාහන ගාස්තු රු.110,904ක් ගෙවා තිබුණි.<br>➢ ප්‍රධාන අමාත්‍යාංශයේ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පැවති වැඩමුළුව සඳහාපෞද්ගලිකඋත්සවශාලාවටරු.351,450 ක් සහ මරණ පරීක්ෂක පුහුණු වැඩ සටහන සඳහා වෙන්කර තිබුණුඋත්සව ශාලාවට රු.95,000 ක් ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | | ➢ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් පවත්වන ලද 2015 අයවැය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව සඳහා හෝටලයකට රු. 654,500 ක් ගෙවා තිබුණි. |
| (ii) | 2011 දෙසැම්බර් 19 දිනැති අංක PCMD/1/4/23/4/4 දරන චක්‍රලේඛය | | දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා වෙනුවෙන් අනුමත සහාය කාර්ය මණ්ඩලයට අමතරව පරිපාලන නිලධාරි තනතුරු 01ක්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරු 10ක්, රියදුරු තනතුරු 06ක් කාර්යාල සහායක තනතුරු 2ක් සඳහා සේවක මණ්ඩලයක් පවත්වා ගෙන ගොස් තිබුණි. |
| (උ) | 2013 මාර්තු 01 දිනැති අංක FC/PR&P/ GL/2013 හා 2014 අප්‍රේල් 21 දිනැති අංක FL/4/2014 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය | 120,332 | එක් එක් විෂය පිළිබඳව වගකීම් දරනු ලබන නිලධාරින් විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් වෙනුවෙන් ඔවුන්ට සම්පත්දායක දීමනා ලබාගත නොහැකි බව දක්වා ඇතත්, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් 2014 වර්ෂයේදී එම විධිවිධාන වලට පටහැනිව රු.120,332 ක සම්පත්දායක දීමනා ගෙවා තිබුණි. |
| (ඌ) | 2014 පෙබරවාරි 16 දිනැති අංක PCE/2014 -03 දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛය | | මෙම චක්‍රලේඛය ප්‍රකාරව 2014 ජනවාරි 16 සිට 2014 දකුණු පළාත් සභා ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල නිකුත් කරන තෙක් සේවකයින් බඳවා ගැනීම සිදුනොකළ යුතු බවට දන්වා තිබුණද දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2014 ජනවාරි 16 සේවකයින් 10 ක්ද ජනවාරි 31 සේවකයකුද බඳවා ගෙන තිබුණි. |
| (එ) | භාණ්ඩාගාර චක්‍රලේඛ<br>------------------------ | | |
| (i) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය, 1998 අගෝස්තු 04 දිනැති අංක 359 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ දකුණු පළාත් සභා මුදල් රීති 560 හා 561 | | ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ඇතුළත්වූ ස්ථාවර වත්කම් ලේඛනයක් පැවැත්විය යුතු වුවත් දකුණු පළාත් සභාව තුළ වූ ආයතන 11 ක් අදාල පරිදි ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |
| (ii) | 2000 ජනවාරි 1 දිනැති අංකPF/PE 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය,2009 මැයි 26 දිනැති අංක39දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2012 අගෝස්තු 20 දිනැති අංකPCMD/1/4/23/1/14 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛය | 9,856,154 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව කිසිදු දීමනාවක් ගෙවිය නොහැකි වුවත් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා එක් නිලධාරියෙකුට මාසයකට රු.2,500 ක් බැගින් වන සේ අන්තර් දීමනාවක් 2013 සැප්තැම්බර් සිට විධිමත් අනුමැතියක් රහිතවගෙවා තිබුණි. මේ ආකාරයට 2013 සැප්තැම්බර් මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා රු.9,856,154 ක් ගෙවා තිබු අතර ඉන් රු.7,477,328ක් ගෙවා තිබුණේ 2014 වර්ෂය වෙනුවෙනි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | | චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංගහා මෘදුකාංග වෙනුවෙන් වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතු වුවත් පහත ආයතන මගින් එසේ පරිගණක පිළිබඳ වත්කම් ලේඛන පවත්වා නොතිබුණි.<br>❖ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>❖ සමුපකාර සේවක කොමිෂන් සභාව<br>❖ දකුණු පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග,ගොවිජන සංවර්ධන , සත්ව නිෂ්පාදන හා සංවර්ධන සහ පරිසර කටයුතු අමාත්‍යාංශය<br>❖ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)<br>❖ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්)<br>❖ දකුණු පළාත් සංවර්ධන අධිකාරිය<br>❖ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| (iv) | 2004 ජූලි 29 දිනැති අංක 25, අගෝස්තු 10 දිනැති අංක 25(I), අගෝස්තු 13 දිනැති 25(II) හා නොවැම්බර් 30 දිනැති අංක 25(III) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | 21,046,755 | රාජ්‍ය ව්‍යවසායයන් සතු මුදල් ආයෝජනය කිරීමේදී පළාත් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු අතර සියලු ආයෝජනයන් රජයේ බැංකු තුළ සිදුකළ යුතුව ඇත. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් විධිමත් අනුමැතියක් රහිතව රු.21,046,755 ක් ආයෝජනය කර තිබුණු අතර ඉන් රු.10,285,901ක් පෞද්ගලික බැංකුවල ආයෝජනය කර තිබුණි. |
| (v) | 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | - | 2011 ජනවාරි 01 දින සිට සියලුම රාජ්‍ය ව්‍යවසායයන් විසින් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව පිළියෙල කළයුතු වුවත්, සමාජ සේවා අරමුදල විසින් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි. |
| (ඒ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-------------------- | | |
| (i) | 1985 මැයි 10 දිනැති අංක 289 හා 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛ | | වෙන්කළ වාහන හැර සියලුම රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවත් දකුණු පළාත් සභාව තුළ වූ ආයතන 06 කට අයත් වාහන 13 ක රාජ්‍ය ලාංඡනය යොදා නොමැති බව නිරීක්ෂණය විය. |
| (ii) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ජේදය | | සෑම මාස 06 කට වරක්ම රජයේ වාහනවල ඉන්ධන භාවිතය පරීක්ෂා කළ යුතු වුවත් දකුණු පළාත තුළ වූ ආයතන 14 ක වාහන 58 ක් වෙනුවෙන් ඉන්ධන භාවිතය පරීක්ෂා කිරීම නියමිත පරිදි සිදුකර නොතිබුණි. |
| (iii) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2006 දෙසැම්බර් 12 දිනැති අංක 2006/13 දරන ප්‍රධාන ලේකම්ගේ (මුදල්) චක්‍රලේඛය | | වාහන අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් කාර්මික වාර්තා චක්‍රලේඛයන්හි සඳහන් නිලධාරීන් වෙතින් පමණක් ලබා ගත යුතු වුවත් ඊට පටහැනිව බෙලිඅත්ත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මෝටර් කාර්මික උපදේශකවරයකුගෙන් ලබාගත් වාර්තාවක් මත පදනම්ව කැබ් රථයක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2014 අගෝස්තු 07 දින රු.65,354 ක් ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරනවක්‍රලේඛය | | චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාමිකයින් නැවත සේවයේ යෙදවිය යුතු වන්නේ සුදුසු අනුප්‍රාප්තිකයින් සොයා ගැනීමට අපහසු අවස්ථාවලදී වුවත්, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනටකළමනාකරණසහකාර ශ්‍රේණියේ නිලධාරීන් 59 දෙනෙකු ආයතනයේ සිටියදී අනුමත නොවූ "සභාපති ලේකම්" තනතුරට විශ්‍රාමික කළමනාකරණ සහකාර ශ්‍රේණියේ නිලධාරිනියක කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. මෙම නිලධාරිනියට 2014 ජුනි දක්වා මසකට රු.25,000 බැගින් රු.150,000 ක් ගෙවා තිබුණි. |
| (v) | 2008 මාර්තු 31 දිනැති අංක 08/2008 දරන චක්‍රලේඛයේ 11.5 ඡේදය | 4,353,814 | දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන සියයට 4 ක පොලි අනුපාතය අතර වෙනස රජය විසින් දැරිය යුතු වුවත් පළාත් පාලන ආයතනවල අරමුදල් මඟින් දරන ලද රු.4,353,814 ක පොලි මුදල් අදාල පළාත් පාලන ආයතන වෙත 2015 ජුනි 01 දින දක්වා ප්‍රතිපූර්ණය කර නොතිබුණි. |
| (ඔ) | 2010මැයි 25 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලයේ සේවය කරනු ලබන රාජ්‍ය සේවයේ නිලධාරීන් නොවන පුද්ගලයින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක කර නොතිබුණි. සේවක අර්ථ සාධක අරමුදලෙහි හෝ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි සාමාජිකත්වයද විධිමත් පරිදි ලබා නොගෙන මොවුන්ගෙන් එකී අරමුදල් සඳහා දායක මුදල් අයකර ආයතනයේ දායකය සමඟ පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. මේ ආකාරයට මාරු කරන ලද රු.12,639,444 ක් 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමෙහි තිබූ අතර ප්‍රමාද වී සාමාජිකත්වය ගනු ලබන පුද්ගලයින්ගේ දායක මුදල් ගෙවීමේදී ඒ සඳහා රු.100,845 ක දඩමුදලක් ගෙවීමටද සිදුවී තිබුණි. අදාල සේවකයින් විසින් අරමුදලේ දායකත්වය ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සාමාජිකත්වය ලබා ගැනීම ප්‍රමාද වී ඇති බැවින් මෙම දඩ මුදල් ඔවුන්ගෙන් අයකළ යුතුව ඇතත් පොදු තැන්පත් ගිණුමට මාරු කරන ලද දායක මුදල් භාවිතා කරමින් මෙම දඩ මුදල් ගෙවා තිබුණි. |
| (ඕ) | අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ<br>------------------------- | | |
| (i) | 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛයේ 1.9 ඡේදය | | කිසිඳු පාසලක ගුරු ඌනතාවයක් ඇති නොවන සේ ගුරු තුලනය කිරීම සිදුවිය යුතු වුවද ඊට පටහැනිව මාතර කලාපයට අයත් පාසල්වල ගුරු පුරප්පාඩු 45ක් හා ගුරු අතිරික්තතා 63 ක් විය. |
| (ii) | 2013 නොවැම්බර් 28 දිනැති අංක 07/2013 දරන චක්‍රලේඛය | | ➢ පාසල් සංවර්ධන සමිතියේ කමිටුව මාසිකව රැස්විය යුතු වුවත් ගාල්ල දිස්ත්‍රික්කයේ මහා විද්‍යාලයක පාසල් සංවර්ධන කමිටුව 2014 වර්ෂය තුළදී හා 2015 මැයි මස දක්වා රැස්ව නොතිබුණි.<br><br>➢ මිලදී ගැනීම් විධිමත් මිල කැඳවීම් මඟින් සිදුකළ යුතු වුවත් මාතර දිස්ත්‍රික්කයේ ආදර්ශ කණිෂ්ඨ |

විද්‍යාලයක වැසිකිළි 2 ක් ඉදි කිරීම වෙනුවෙන් රු.86,887 ක භාණ්ඩ, මිල කැඳවීමකින් තොරව මිලට ගෙන තිබුණි.

(ක) ප්‍රධාන ලේකම් චක්‍රලේඛ
----------------------------

(i) 2014 ජනවාරි 24 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛය

රුහුණු සංචාරක කාර්යාංශයෙහි සේවක ඇප තැබිය යුතු නිලධාරින් 8 දෙනෙකු ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2014 ඔක්තෝබර් 15 දිනැති අංක 04/2014 දරන මුදල් චක්‍රලේඛය හා දකුණු පළාත් සභා මුදල් රීති 474 හා 476

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ඊළඟ වර්ෂයේ මාර්තු 15 ට පෙර සිදුකර එකී වාර්තා විගණකාධිපති වෙත එවිය යුතු වුවත් දකුණු පළාත තුළ වූ ආයතන 08 ක 2014 වාර්ෂික සමීක්ෂණ සිදුකර වාර්තා විගණකාධිපති වෙත එවා නොතිබුණි.

(ග) 1996 අගෝස්තු 01 දිනැති අංක 04/10 දරන බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද ඉඩම්කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය

චක්‍රලේඛය ප්‍රකාරව බදු මුදල් පාලන ගිණුම හා හිඟ පාලන ගිණුම සකස් කළ යුතු වුවත් එම පාලන ගිණුම් පිළියෙල කර නොතිබුණි.

(ඝ ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය
---------------------------

(i) 2.5.1(ඇ)

ප්‍රසම්පාදනය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පළ කිරීම, ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කිරීම, ලංසු කැඳවීම අවසන් කිරීම සහ ලංසු විවෘත කිරීම යන කරුණු සහ දිනයන් තීරණය කිරීම ප්‍රසම්පාදන කමිටුවේ වගකීම සහ කාර්යභාරය විය. එසේ වුවත්2014 වර්ෂයේ සිදුකර තිබුණු රු.6,889,057 ක් වටිනා වාහන අලුත්වැඩියා වලට සහ දිස්ත්‍රික් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට අවශ්‍ය ෆයිල් බෑග් හා food sample kit මිලදී ගැනීමට අදාල සියලුම ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටීන් ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර නොතිබුණි.

(ii) 2.11.3 (අ) සහ දකුණු පළාත් සභා මුදල් රීති 436.1

ප්‍රසම්පාදන කමිටුව ආරම්භ කළ වේලාව වාර්තාවේ අඩංගු විය යුතු අතර නියමිත ආකෘති පත්‍රය අනුව වාර්තාව පිළියෙල කර ප්‍රසම්පාදන රැස්වීම අවසන් වූ වහාම කමිටු නිලධාරීන්ගේඅත්සන ලබාගත යුතුවිය. 2014 වර්ෂය වෙනුවෙන් සිදුකර තිබුණු රු.13,557,489 ක් වටිනා ප්‍රසම්පාදන තීරණ 109 ක් සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් කිසිවෙකු සහභාගී නොවී තිබුණ අතර, රු.16,682,896 ක් වටිනා ප්‍රසම්පාදන තීරණ 121 ක් සඳහා ප්‍රසම්පාදන කමිටුවේ දෙවන සාමාජිකයාද , රු.753,379 ක් වටිනා ප්‍රසම්පාදන 12 ක් සඳහා

ප්‍රසම්පාදන කමිටුවේ දෙවන හා තෙවන සාමාජිකයින් යන දෙදෙනාද සහභාගීවී නොතිබුණි.

## 2.2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාව රු.117,582,228 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර මේ සඳහා මුදල් කොමිෂන් සභාවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) ජාතික රක්ෂණ භාර අරමුදලින් නිකුත් කළණය සුරැකුම් රක්ෂණාවරණයේ කොන්දේසියක් ලෙස "යම් නිළධාරියෙකු වෙනුවෙන් නිකුත් කරනු ලබන ණය සුරැකුම් රක්ෂණාවරණයක් ඔහු රජයේ සේවයෙන් ඉල්ලා අස්වන හෝ ධූරය අත්හැර යන හෝ සේවයෙන් පහකරනු ලබන දිනයේ හෝ සිට බල නොපැවැත්වෙන බව " සඳහන් කර තිබුණි. ඒ අනුව කිසිඳු ඇපයකින් සුරක්ෂිත නොවන තත්වයක් යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල් රක්ෂණාවරණය යටතේ පහත ආයතන ලබාදී ඇති ණය මුදල් නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් අවදානම් තත්ත්වයක් පැන නැගිය හැකි බව විගණනයට නිරීක්ෂණය විය.

| ආයතනය | නිලධාරීන්ගණන | ණය මුදල |
|---|---|---|
| | | රු. |
| ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | 12 | 1,421,650 |
| සමූපකාර සේවක කොමිෂන් සභාව | 01 | 152,150 |

(ඇ) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II පංතියේ තනතුරක් වන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) තනතුරේ 2014 සැප්තැම්බර් 02 දින සිට වැඩ බැලීම සිදුකරන නිලධාරියා 1984 ජනවාරි 02 දින දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සහතිකලත් ගුරුවරයෙකු වශයෙන් ගුරු සේවයට එක්ව තිබූ අතර දේශපාලන පලිගැනීම් සහන නිර්දේශ 2001,ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව හා ඊට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පංතියට අධිසේවක පදනම මත පත්කර තිබුණි. එම පත්වීමට අදාල කොන්දේසි හා නියමයන් අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිත්‍ය තනතුරකට පත්වීම එම සේවාවේ සේවා ව්‍යවස්ථාව අනුව සිදුවිය යුතු බව දක්වා තිබූ අතර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අදාල කිසිඳු තනතුරකට මෙමඟින් බලපෑමක් නොවිය යුතු බවද දක්වා තිබුණි. නමුත් ඊට පටහැනිව 2005 අප්‍රේල් 05 දින සිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරුවලට නිත්‍ය හා වැඩ බැලීමේ පදනම මත විධිමත් අනුමැතියකින් තොරව මෙම නිලධාරියා පත් කර තිබූ අතර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පංතිය ලෙස මොහුගේ තනතුරු නාමයද භාවිතා කර තිබුණි.

(ii) ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ රජයේනිලධාරින්ටඅත්තිකාරම්ගිණුමෙහි ලැබීම්වල සංශෝධිත අවම සීමාව රු.19,000,000 ක් වූ අතර එය වර්ෂය අවසානයේ තත්‍ය අගය සමඟ රු.532,847කින් අනුකූල නොවීය.

(iii) දකුණු පළාත් පාසල්වල පවතින ගුරු ඇබැර්තු සඳහා උපාධිධාරින් 700 ක් බඳවා ගැනීම

- ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අයදුම්පත් කැඳවා අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා ලැබෙන අයදුම්පත්‍ර ප්‍රමාණය කොට්ඨාශ වෙනුවෙන් පවතින ඇබැර්තු සංඛ්‍යාවට සමාන හෝ අඩුනම්

තරග විභාගයකින් තොරව සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීමට තීරණය කර ඒ අනුව පුවත්පත් දැන්වීමක් පළකර තිබුණි.

- ගුරු ව්‍යවස්ථාවට අනුව පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත අදාල පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන පුද්ගලයන් පත් කරනු ලැබිය යුතු වුවද ,ලිඛිත තරග විභාගයක් පැවැත්වීමට පෙර 8830 ක් වූ සියලු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර තිබුණි.

- ඒ අනුව 2008 දෙසැම්බර් 22 දිනැති අංක 24/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සම්මුඛ පරීක්ෂණ මණ්ඩල කටයුතු අධීක්ෂණය කිරීම වෙනුවෙන් කිසිඳු ලේඛනගත සාක්ෂියක් නොමැතිව දකුණු පළාත් අධ්‍යාපන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට රු.109,005 ක් සහ විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයකුට රු.10,260 ක් ගෙවා තිබුණි. මීට අමතරව 2015 මාර්තු 23 දින විගණන අවස්ථාව වන විට රු.98,745 ක් වූ වවුචරයක් අනුමත කර විශ්‍රාමික නිලධාරියාටගෙවීමසඳහා සූදානම් කර තිබූ බවද අනාවරණය විය.

- විශ්‍රාමික නිලධාරියකු මෙම බඳවා ගැනීම් කටයුතු සඳහා සම්බන්ධ වී තිබුණද ඒ සඳහා කිසිඳු ලිඛිත අනුමැතියක් ලැබී නොතිබුණි.

(ඇ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

---

(i) 2014 ජුනි 17 දිනැතිඅංක දපස/ප්‍ර.අ./සැල/සං/07/1/14 දරන ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබූ සෞඛ්‍ය සංවර්ධන සැලැස්මට අදාලව ව්‍යාපෘති 2 ක් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන 2014 සැප්තැම්බර් 01 දින සංශෝධනය කර තිබුණද, ඒ සම්බන්ධව අවධානය යොමු නොකර සංශෝධිත ප්‍රතිපාදන ඉක්මවා රු.1,860,000 ක් වැයකර තිබුණි.

(ii) 2014 ජුනි 17 දිනැති අංක දපස/ප්‍ර.අ./සැල/සං/07/1/14 ප්‍රධාන අමාත්‍ය, මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන, .... අමාත්‍යාංශය 2014 සෞඛ්‍ය සංවර්ධන සැලැස්මේ නව වැඩ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා ව්‍යාපෘති 07 ක් සඳහා රු.865,539 ක වියදමක් දරා තිබුණි.

(ඉ) වැඩ බැලීම සඳහා විධිමත් පත්වීම් ලිපියක් නොමැතිව මාතර ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරයේ ස්ථාන භාර නිලධාරී හා අධීක්ෂණ නිලධාරී වශයෙන් කටයුතු කිරීම වෙනුවෙන් මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාට පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින්සිය නිත්‍ය තනතුරේ මූලික වැටුපෙන් සියයට 25ක මාසික වැඩ බැලීමේ දීමනාවක් ලෙස 2011 දෙසැම්බර් සිට 2014 අගෝස්තු දක්වා රු.224,205 ක් ගෙවීම් කර තිබුණි.

(ඊ) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

---

(i) දකුණු පළාත් කාන්තා රැඳවුම් නිවාසය තුළ පිහිටි උපදේශන සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2013 පෙබරවාරි 14 සිට නිල නිවසක් ලෙස භාවිතා කර තිබූ අතර බාල වයස්කාර දැරියන්ගේ උපදේශන කටයුතු සඳහා පිහිටුවන ලද උපදේශන මධ්‍යස්ථානයක් මෙලෙස නිලනිවාසයක් ලෙස යොදා ගැනීමෙන් උපදේශන මධ්‍යස්ථානය පිහිටුවීමේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව අනාවරණය විය.

(ii) 1992 මාර්තු 19 දිනැතිඅංකසේ/3/4/12 දරනදකුණු පළාත් පරිවාසහාළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ ලිපියටඅනුව දිවා සුරකුම් මධ්‍යස්ථාන(ළදරු උයන්) වල සේවා තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඒවායේ පාලිකාවන්වෙනුවෙන්මාසික දිරිදීමනාවක් හා මාසික නඩත්තු දීමනාවක් ගෙවීම අනුමත කර තිබුණි. නමුත් 2014 වර්ෂයේ ගෙවා තිබුණු රු.368,800 ක දිරි දීමනාව හා රු.616,100 ක නඩත්තු දීමනාව ගෙවා තිබුණේපෙර පාසල් පාලිකාවන්ට හා පෙර පාසල්සඳහා විය.

(ඌ) ක්‍රීඩා,යෞවන කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආර්ථික ප්‍රවර්ධන, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු, නිවාස හා ඉදිකිරීම් සහ මිනිස්බල හා රැකිරක්ෂා අමාත්‍යාංශයේඅංශයක්ව පැවති ග්‍රාම සංවර්ධන අංශය, දෙපාර්තමේන්තුවක් ලෙස සලකා කාර්ය මණ්ඩලය අනුමත කිරීම හා එසේ අනුමත තනතුරු සඳහා වැඩ බැලීමට නිලධාරින් පත් කිරීම සිදුකර තිබුණද දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය නීතිමය විධිවිධාන අනුගමනය කර අනුමැතිය ලබා ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. සියලුම ගරු ආණ්ඩුකාරවරුන් අමතන ලද ජනාධිපති ලේකම්ගේ 2014 ජුලි 03 දිනැති අංක පීසීඑම්ඩී/1/2/23/4(II) දරන ලිපිය පරිදි පළාත් සභාවන් විසින් දෙපාර්තමේන්තු ස්ථාපිත කිරීමේදී 2013 ඔක්තෝබර් 31 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් පරිදි පත්කරන ලද කමිටුවේ වාර්තාව අනුව කටයුතු කළ යුතු වුවත් මෙහිදී ඒ අනුව කටයුතු කර නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඍ) දකුණු පළාත් ධීවර,සංස්කෘතික, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

---

(i) මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට මත්ස්‍ය අලෙවිය සඳහා විශේෂයෙන් සැකසූ ත්‍රීරෝද රථ 100 ක් ලබාදීමේ වැඩසටහන යටතේ බැංකුවක් හරහා ලබාදී තිබූ ත්‍රීරෝද රථ 03 න් එකක් මගී ප්‍රවාහන ත්‍රීරෝද රථයක් බවත් මේ සඳහා රු.10,000ක මුදලක් අමාත්‍යාංශය මගින් වැය කර ඇති බවත් අනාවරණය විය.

(ii) උම්බලකඩ සැකසීමේ පෝරණු 50 ක් මිලට ගැනීම සඳහා පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමට ප්‍රථම රු.2,471,000 ක වටිනාකමකින් යුතු භාණ්ඩ මිලදී ගැනීමට අදාළ ආයතන සමඟ 2014 දෙසැම්බර් 24 දින ගිවිසුම්වලට එළඹතිබූ බව නිරීක්ෂණය විය.

(එ) අම්බලන්තොටප්‍රාදේශීය ලේකම් කාර්යාලය

---

සැලසුම්ශිල්පීනිලධාරීන්ගේ ක්ෂේත්‍ර රාජකාරී වියදම් පරීක්ෂාවේදී ඉදිරි වැඩසටහන් හා ඉටුකළ වැඩසටහන් ඉදිරිපත් කිරීමෙන් තොරව සහ නිලධාරියාගේ රාජකාරි ලැයිස්තුව අනුව ව්‍යාපෘති සඳහා යෝජිත භූමිය පරීක්ෂා කර අවශ්‍ය සැලසුම් ඇඳීම සඳහා පමණක් ක්ෂේත්‍රයේ රාජකාරිවල නිරත විය හැකි සැලසුම් ශිල්පී විසින් 2014 වර්ෂයේ දින 225½ ක් ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ ක්ෂේත්‍ර රාජකාරි කටයුතුවල යෙදීම වෙනුවෙන් ගමන් වියදම් හා දීමනා ලෙස රු.149,729 ක් ලබා ගෙන තිබුණි.

(ඒ) 2012 හා 2013 වර්ෂවල දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම යටතේ වියදම් දැරීම සඳහා දකුණු පළාත් සංස්කෘතික අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදන වලින්රු.265,000 ක මුදලක් මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන නියමයන් අනුගමනය කිරීමකින් තොරව බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විවිධ ව්‍යාපෘති වෙනුවෙන් වියදම් කර තිබුණි.

(ඔ) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - හම්බන්තොට

---

2013 දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ හම්බන්තොට කොට්ඨාශයේ ආයතන සඳහා රෝගී ඇඳන් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2. (අ) ප්‍රකාරව මිල පිරිවිතරයන් සවිස්තරව සකස් කිරීමකින් තොරව මිල ගණන් කැඳවා තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවවිසින්රෝගී ඇඳක් සඳහා රු.11,875 ක අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීම සුදුසු යැයි නිර්දේශ කර තිබියදී එයට පටහැනිව එකක් රු.27,500 බැගින් වෙනත්ආයතනයකින් ඇඳන් 20 ක් මිලදී ගැනීම නිසා රු.312,500 ක් වැඩිපුර ගෙවා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඕ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) කාර්යාලයේ 2014 උපමාන පාදක සංවර්ධන සැලැස්ම යටතේ වූ ව්‍යාපෘති 6 ක් සඳහා අනුමත මුදල වූ රු.7,686,356 ඉක්මවා රු.10,438,432 ක වියදමක් දැරීම හේතුවෙන් රු.2,752,076 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ක) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

---------------------------------------------------

(i) දකුණු පළාත් සභා මුදල් රීති 29 ට පටහැනිව වැය විෂය අංක 316-3-2-2102 සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ලිබඩු හා උපකරණ මිලදී ගැනීම සඳහා වෙන්කරගත් රු.18,600,000 ක මුදලින් 2014 දෙසැම්බර් 31 දිනැති දකුණු පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ අංක 689.5 ට අනුව වැටුප් හා දීමනා, වාහන අළුත්වැඩියා , වාහන කුලියට ගැනීම, අතිරේක ඉන්ධන දීමනා ලබාදීම, ගොඩනැගිලි අළුත්වැඩියා වහා ඊට අමතරව ගොඩනැගිලි නවීකරණය ආදී පුනරාවර්තන වියදම්වලට රු.7,050,000 ක් වැයකර තිබුණි.මෙකී අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) 2013 වර්ෂයේදී කැකණදුර ගොවිපල ආශ්‍රිතව පැවති “රුහුණු අසිරිය "ගොවි ප්‍රදර්ශනයේ ටිකට්පත් අලෙවි ආදායම රු.305,880 ක් වූ අතර ඊට සහභාගි වු නිලධාරීන්ගේ ගමන් වියදම් ලෙස රු.142,181 ක මුදලක් ගෙවා ඉතිරි රු.163,699 ක මුදල 2014 අගෝස්තු 29 දින රජයේ ආදායමට බැරකර තිබූ නමුත් ආදායම් මුදලින් ගමන් වියදම් ගෙවීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ග) දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

---------------------------------------------

(i) කාර්යාලය මඟින් රු.112,123 ක් වැයකර 2014 අගෝස්තු 30 දින වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද 2015 අයවැය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව සඳහා සහභාගි විමට අනුමැතිය ලැබුණු නිලධාරින් 44 ක් අතුරින් ආයතන ප්‍රධානීන් 5 ක් සහ තවත් නිලධාරියෙකුද ඇතුළුව 6 දෙනෙකු ඊට සහභාගි වී නොතිබුණු අතර අනුමැතිය නොලත් පුද්ගලයින් 34 ක් ඊට සහභාගි වු බවට අත්සන් යොදා තිබුණි.

(ii) ගාල්ල මහා නගර සභාවේ හිටපු නගරාධිපතිවරයා සම්බන්ධ විමර්ශන නිලධාරින්ගේ චෝදනා පත්‍රයේ සඳහන් කරුණු පිළිබඳ පරික්ෂා කර වාර්තා කිරීම පිණිස මහා නගර සභා ආඥාපනතේ 277 වගන්තිය ප්‍රකාරව පත්කළ විශේෂ පරීක්ෂණ මණ්ඩලය සඳහා වූ රු.2,053,158 ක වියදම් සඳහා දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩල තීරණ අංක 576:4 සහ 649:3 යටතේ අනුමැතිය ලබාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් පළාත් ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ච) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

---------------------------------------------

(i) විධිමත් උසස් කිරීම් පරිපාටියක් අනුමතවී නොතිබියදී සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ රියදුරු , කම්කරු, කාර්යාල කාර්ය සහායක යනාදි තනතුරු 11 කට අයත් පුද්ගලයින් 70 ක් සඳහා වසර 4 කට වරක් උසස්වීම් ලැබෙන පරිදි උසස්වීම් ලබාදී තිබුණි.

(ii) 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2012 ජනවාරි 01 දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාවට අයත් නිලධාරීන්ට මාසිකව රු.15,000 ක දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. මෙම අධිකාරියේ සේවයේ නියුතු ඉංජිනේරුවරුන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නොවන බැවින් ඉහත දීමනාව ලබාගැනීම සඳහා හිමිකමක් නොතිබියදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ අනුමැතියකින් තොරව ඉංජිනේරුවන් සඳහා 2014 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා පමණක් රු.2,734,645 ක් ගෙවා තිබුණි. දකුණු පළාත් ප්‍රධාන ලේකම් හා විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් අවස්ථා කිහිපයකදී අනුමැතිය ලබාගැනීමකින් තොරව මෙම දීමනාව, ගෙවීම නතර කරන ලෙස සාමාන්‍යාධිකාරීවරයාට දන්වා තිබුණද එකී කිසිදු නියෝගයකට අවනත නොවී දිගින් දිගටම මෙම දීමනාව ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ජ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

(i) උපමාන පාදක ව්‍යාපෘති යටතේඅධිකාරිය විසින් දකුණු පළාත් පෙර පාසල් ළමුන් වෙනුවෙන් ප්‍රකාශනයක් නිර්මාණය කිරීම වෙනුවෙන් 2013 වර්ෂය සඳහා රු.1,000,000ක හාසමාලෝචිත වර්ෂය සඳහා රු.600,000ක ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත් 2013 වර්ෂයේදී රු.5,109,685ක වියදමක්හා 2014 වර්ෂයේදී රු.2,100,000ක වියදමක් දරා තිබීමෙන් සිදුව තිබූ රු.5,609,685ක ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමට අදාල අනුමැතිය 2015 ජූලි 31 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

(ii) අධිකාරිය විසින් මෙම පෙර පාසල් ළමුන් සඳහා වූ ප්‍රකාශනයක් මුද්‍රණය කිරීම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිල ගණන් කැඳවීමකින් තොරව සිදුකර තිබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවීම සම්බන්ධයෙන් කිසිඳු අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ මන්ත්‍රී ප්‍රතිපාදන බැංකු ජංගම ගිණුමෙන් රු.8,000,000 ක මුදලක් පොදු ජංගම ගිණුමටද, පොදු ජංගම ගිණුමෙන් රු.900,000 ක මුදලක් රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් වලට අදාල බැංකු ජංගම ගිණුමටද මාරු කර තිබූ අතර මෙම අග්‍රිම මාරු කිරීම් විධිමත් ලිඛිත අනුමැතියකින් තොරව වාචික උපදෙස් මත සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලදී එසේ මාරු කරන ලද රු.8,750,000ක අග්‍රිම මාරුකිරීම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

## 3. ආදායම් කළමනාකරණය

2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා බදු ආදායම සහ බදු නොවන ආදායම පහත පරිදි විය.

| වර්ෂය | බදු ආදායම | බදු නොවන ආදායම | ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායමේ වැඩිවීම/(අඩුවීම) | | | |
|---|---|---|---|---|---|---|
| | | | බදු ආදායම | | බදු නොවන ආදායම | |
| | | | මුදල රු. මිලියන | ප්‍රතිශතය | මුදල රු. මිලියන | ප්‍රතිශතය |
| | රු.මිලියන | රු.මිලියන | | | | |
| 2010 | 2,532 | 520 | 427 | 20.29 | 11 | 2.12 |
| 2011 | 3,705 | 570 | 1,173 | 46.33 | 50 | 9.62 |
| 2012 | 3,890 | 619 | 185 | 4.99 | 49 | 8.60 |
| 2013 | 4,039 | 717 | 149 | 3.83 | 98 | 15.83 |
| 2014 | 4,864 | 546 | 825 | 20.43 | (171) | (23.85) |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) හිඟහිටි පිරිවැටුම් බදු

2014 ජුනි 30 දිනට හිඟහිටි පිරිවැටුම් බදු ශේෂය රු.63,044,914 ක් විය. පිරිවැටුම් බදු ආදායම් අහෝසි කර වසර 3 ක් ගතවී ඇතත් 1992 වර්ෂයේ සිට පැවති හිඟහිටි ආදායම් අයකර ගැනීමට අපොහොසත්ව තිබූ අතර, අධිකරණය මගින් අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයන්ට එළඹී ඇතත් හිඟහිටි ආදායම් අයකර ගැනීමේ මන්දගාමී ස්වරූපය නිසා ඒවා අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) බනිජ අයිතීන් මත හිඟබදු

-----------------------------

2014 ජුනි 30 දිනට පැවති බනිජ අයිතීන් මත හිඟබදු ශේෂය රු.10,456,481 ක් වන අතර ඉන් රු.7,040,269 ක් 2003 - 2006 කාලපරිච්ඡේදයට අදාල විය.

(ඇ) ඖෂධ හා රසායනික හිඟබදු

-------------------------------

2014 ජුනි 30 දිනට ඖෂධ හා රසායනික හිඟබදු ශේෂය රු.1,197,948 ක් වන අතර 2013 දෙසැම්බර් 31 දින පැවති 2001 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා හිඟබදු ශේෂයන්ගෙන් 2014 මුල් අර්ධ වර්ෂයේදී සියයට1 ක ප්‍රතිශතයක් අයකර තිබූ අතර සියයට 3.6 ක ප්‍රතිශතයකින් බදු නිදහස් කර තිබුණි.

**4. මූල්‍ය සමාලෝචනය**

**------------------------**

**4.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේරු.741,086,680ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.130,858,734 ක් විය.

**4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-------------------------------------**

| විෂයය | 2014 වර්ෂය | 2013 වර්ෂය | වැඩිවීම/(අඩුවීම) | |
|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | % |
| ආදායම | 5,410,464 | 4,755,429 | 655,035 | 14 |
| වියදම | (22,515,066) | (19,458,243) | 3,056,823 | 16 |
| ඌනතාවය | (17,104,602) | (14,702,814) | 2,401,788 | 16 |
| රජයේ ප්‍රදාන | 17,845,688 | 14,833,673 | 3,012,015 | 20 |
| රජයේ ප්‍රදාන වලින් පසු අතිරික්තය | 741,086 | 130,859 | 610,227 | 466 |

(i) බදු නොවන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.170,719,971 කින් හෙවත් සියයට 23.82 කින් අඩුවීතිබියදී මුළු ආදායමේ සියයට 14 ක වර්ධනයට බදු ආදායම රු.825,754,950 ක් හෙවත් සියයට 20.45 කින් වර්ධනයවීම හේතුවී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමේ රු.2,387,902,427 ක් හෙවත් සියයට 13.45 ක වැඩිවීමක්ද ප්‍රාග්ධන වියදමේ රු.673,615,298 ක් හෙවත් සියයට 39.94 ක වැඩිවීමක්ද නිරීක්ෂණය විය.

**5. අධිකාරි ගිණුම්/අරමුදල් ගිණුම් හා වානිජ අත්තිකාරම් ගිණුම්**

**------------------------------------------------------------------**

**5.1 අධිකාරි ගිණුම් / අරමුදල් ගිණුම්**

**-------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් සභාව තුළ ක්‍රියාත්මක අධිකාරි 05 ක් ද අරමුදල් 06ක් ද පැවැති අතර ඒවායේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අධිකාරියේ/ අරමුදලේ නම | මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ දිනය |
|---|---|
| **අධිකාරි** | |
| (i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 2015.08.28 |
| (ii) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | 2015.07.08 |
| (iii) දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය | ලැබී නැත |
| (iv) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය | 2015.07.17 |
| (v) රුහුණු සංචාරක කාර්යංශය | 2015.07.17 |
| **අරමුදල්** | |
| (i) පළාත් දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල | 2015.03.31 |
| (ii) හදිසි අවස්ථා අරමුදල | 2015.03.31 |
| (iii) සමුපකාර සංවර්ධන අරමුදල | 2015.08.19 |
| (iv) සමාජ සේවා අරමුදල | 2015.03.30 |
| (v) පළාත් ක්‍රීඩා අරමුදල | 2015.04.21 |
| (vi) සංස්කෘතික හා කලා කටයුතු අරමුදල | 2015.06.17 |

(ආ) පළාත් දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල හා සංස්කෘතික කලා කටයුතු පිළිබඳ අරමුදලේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක්ද, හදිසි අවස්ථා අරමුදලේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් තත්ත්වාගණනය නොකළ මතයක්ද ප්‍රකාශ කර තිබුණි.

## 5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

(අ) වාණිජ අත්තිකාරම් ගිණුම් 11 ක මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | 2014 ලාභය කල්පිත ගාස්තුරහිතව | 2014 ලාභය කල්පිත ගාස්තු සහිතව | 2013 ලාභය කල්පිත ගාස්තු රහිතව | 2013 ලාභය කල්පිත ගාස්තු සහිතව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 30602 | තත්ත්ව පරීක්ෂණාගාර අත්තිකාරම් ගිණුම | 10,059,358 | 7,514,433 | 18,317,737 | 15,718,512 |
| 30702 | ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම | 11,195,858 | 1,137,955 | 9,471,884 | 1,815,604 |
| 31402 | සහතික කළ බීජ හා වගා ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුම | 65,818 | - | 5,667 | - |
| 31403 | ලබුදූව ගොවිපල අත්තිකාරම් ගිණුම | 3,431,680 | (15,158,745) | 6,360,920 | (11,941,953) |

| | | | | | |
|---|---|---|---|---|---|
| 31404 | පෝද්දිවල ගොවිපල අත්තිකාරම් ගිණුම | (922,635) | (8,236,576) | (655,023) | (6,911,140) |
| 31405 | තෙලිජ්ජවිල ගොවිපල අත්තිකාරම් ගිණුම | (437,760) | (12,744,964) | 492,032 | (11,168,888) |
| 31602 | කැකණදුර කුකුළු ගොවිපල පවත්වාගෙන යාම හා බීජ රක්නාගාර නඩත්තු අත්තිකාරම් ගිණුම | 788,347 | (6,567,776) | 1,746,285 | (7,944,086) |
| 31603 | කැකණදුර පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යෑම | 56,414 | (6,027,750) | 172,564 | (655,645) |
| 31902 | පේෂ හා කුඩා කර්මාන්ත අත්තිකාරම් ගිණුම | 12,020,633 | (134,990,505) | 6,602,741 | (129,672,617) |
| 32148 | වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය | 7,831,145 | 1,219,832 | 2,298,195 | (1,932,133) |
| 32149 | බෝගහපැලැස්ස නිවාඩු නිකේතනය හා පුහුණු මධ්‍යස්ථානය | (80,656) | (947,889) | (407,084) | (547,967) |

(ආ) ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අත්තිකාරම් ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂයේ ආරම්භක නිමි හා නොනිමි තොගය පිළිවෙලින් රු.7,271,586 ක් හා රු.1,222,191 ක් වු අතර එම අගයන් නිෂ්පාදන ගිණුමට හා වෙළඳ ගිණුමට ගැලපීමේදී ආරම්භක නිමි තොගය ආරම්භක නොනිමි ලෙසද ආරම්භක නොනිමි තොගය ආරම්භක නිමි තොගය ලෙසද ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.6,049,395 කින් නිෂ්පාදන පිරිවැය වැඩිවී තිබුණි.

(ඇ) බෝගහපැලැස්ස නිවාඩු නිකේතනය හා පුහුණු මධ්‍යස්ථානය

(i) සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ දැක්වෙන ඉකුත් වර්ෂයේ ස්කන්ධය හා වගකීම්වල එකතුව රු.35,339,241 ක් වුවත්, එය රු.34,544,544 ක් ලෙස දක්වා තිබීමෙන් රු.794,697 ක වෙනසක් නිරික්ෂණය විය.

(ii) මෙම මධ්‍යස්ථානය සංචාරක නිකේතනයක් ලෙස මෙන්ම පුහුණු වැඩමුළු හා දේශණ පැවැත්වීම ප්‍රධාන අරමුණු වශයෙන් පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණේ වැඩ මුළු 02 ක් පමණි. මූල්‍ය ප්‍රකාශන අනුව පුහුණු වැඩමුළු පැවැත්වීමෙන් උපයා තිබුණේ රු.8,000 ක් වු අතර 2013 වර්ෂයේදීද පුහුණු වැඩමුළු හා දේශණ පැවැත්වීමෙන් රු.16,000 ක ආදායමක් පමණක් උපයා තිබුණි.

(ඈ) වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේඉකුත් වර්ෂවලට අදාල වු රු.493,653 ක උපචිත ආදායම් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ලබුදූව ගොවිපල අත්තිකාරම් ගිණුම

(i) දෙපාර්තමේන්තු පොත් අනුව භාහාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු බැර කිරීම්වල රු.3,326,628 ක වෙනසක්ද හර කිරීම්වල රු.1,580,701ක වෙනසක්ද 2014 දෙසැම්බර් 31 දිනට ශේෂයෙහි රු.1,745,929 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

(ii) වෙළඳ ගිණුමෙහි ආරම්භක නිමි තොගය රු. 82,657 ක් ලෙස සලකා තිබුණද අලෙවි සැලේ 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබූ මස් හා බිත්තර, බේකරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වටිනාකම ඇතුළත් රු.328,169 ක් වූ තොගය 2013 මූල්‍ය වර්ෂයේ අවසාන තොගයට ඇතුළත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ ආරම්භක නිමි තොගය එම වටිනාකමෙන් අඩුවෙන් දැක්වුණි.

(iii) වෙළඳ ගිණුමෙහි අවසන් තොගය ලෙස මස් හා බිත්තර, බේකරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන යන අයිතමයන්හි වටිනාකම රු.32,300 ක් දක්වා තිබුණද 2014 දෙසැම්බර් 31 දිනට අලෙවි සැලෙහි වූ රු.209,193 ක වටිනාකමකින් යුතු ඉතිරි තොගය අවසන් තොගයට ඇතුළත් කර නොතිබුණි.

(iv) 2014 වත්කම්වාර්තාවඅනුවසත්ත්වආහාරඅවසානතොගයදැක්වීමේදීවර්ග 06 කටඅයත් සත්ත්ව ආහාරවල 2014 දෙසැම්බර් 31 දිනට දක්වා ඇති තොග ශේෂයන්ගේ වටිනාකම සහ විගණනයේදී ගණනය කිරීම් අනුව අවසාන තොග ශේෂයේ වටිනාකම අතර රු.338,730 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට සත්ත්ව ආහාර තොගයේ වටිනාකම රු.338,730 ක් අඩුවෙන් තක්සේරු කර ගිණුම් ගත කර තිබුණි.

(v) 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලහා ලෙජර් ගිණුම්වල හානි හා පාඩු ලෙස රු.131,125 ක් ගිණුම්ගත කර තිබුණද මු.රෙ 109 යටතේ පොත්වලින් කපාහැරීමට අනුමැතිය ලබාදුන් වටිනාකම රු.758,431 ක් වූයෙන් ගිණුම්ගත නොකළ ජීවී තොග හානිවල වටිනාකම රු.627,306ක් බව විගණනයේදී අනාවරණය විය.

(ඊ) තෙලිජ්ජවිල ගොවිපල අත්තිකාරම් ගිණුම

(i) 2014 වර්ෂය තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වැය ශීර්ෂ මගින් මිලට ගෙන තිබූ රු.259,240 ක් වටිනා වත්කම් වර්ග 04 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරනොතිබුණි.

(ii) බඩු වට්ටෝරු හා යන්ත්‍රෝපකරණ තොගයෙහි තක්සේරු වාර්තාවේ ආරම්භක තොගය රු.2,739,795 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.2,841,334 ක් ලෙස දක්වා තිබූ හෙයින් රු.101,539 කවෙනසක් නිරීක්ෂණය විය.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට පැවති රු.220,647 ක් වූ අවසන් තොගය 2014 ජනවාරි 01 දිනට ආරම්භක තොගය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි

(iv) 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.218,688 ක් වූ තොග ශේෂයන් 07 ක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(v) එකතු වටිනාකම රු.287,031,824 ක් වූ ගිණුම් විෂයයන් 04 ක හිමිකම් ඔප්පුව, ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන , වාහන ලේඛනය , හානි පාඩු ලේඛනය යනාදී සාක්ෂි නොතිබීම නිසාවිගණනයේදී ඒවාපරීක්ෂා කිරීමට නොහැකි විය.

(උ) පෝද්දිවෙල ගොවිපලඅත්තිකාරම් ගිණුම
------------------------------------------

(i) වර්ෂය තුළ ලැබීම්වල අවම සීමාව රු.12,000,000 ක් වුවද, වර්ෂය තුළ තත්‍ය ලැබීම්වල වටිනාකම රු.9,372,640 ක් වුයෙන් රු.2,627,360 කින් ලැබීම්වල අවම සීමාවට ළඟා වීමට නොහැකිව තිබූ බව නිරීක්ෂණය විය.

(ii) එකතු වටිනාකම රු.28,507,156 ක් වූ ගිණුම් විෂයයන් 04 ක හිමිකම් ඔප්පුව, ස්ථාවර වත්කම් ලේඛනය, ශේෂ සනාථ සහතිකයනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඌ) තත්ත්ව පරීක්ෂණාගාර අත්තිකාරම් ගිණුම
--------------------------------------------

(i) මුදල් රෙගුලාසි 500(4) අනුව අත්තිකාරම් ගිණුම් කටයුත්ත සඳහා වූ ප්‍රාග්ධන වියදම් සියල්ලම ඇස්තමේන්තුවල ඒ සඳහා නිශ්චිතව සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදනවලින් දැරිය යුතු බවත් එම වියදම් අත්තිකාරම් ගිණුමට හර නොකළ යුතු බව දක්වා ඇතත්, ඊට පටහැනිව රු.118,900 ක ප්‍රාග්ධන වියදම් තත්ත්ව පරීක්ෂණාගාර අත්තිකාරම් ගිණුම මඟින් දරා තිබුණි.

(ii) මාතර හා ගාල්ල ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරවල ස්ථාවර වත්කම් පිළිබඳව 2015 ජුනි 01 සහ 04 දිනවල සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී රු.404,058 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 07 ක් හා වටිනාකම් දක්වා නොතිබූ අයිතමයක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර නිෂ්ක්‍රියව පැවතුණි.

## 6. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

## 6.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව
--------------------------------------------

(i) උඩුගම කලාපයේ ගුරුවරු 5 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අයෙකු 1991 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වටිනාකම රු.153,793 ක්වූ වැටුප් රහිත නිවාඩු දින650 ½ ක් ලබාගෙන තිබුණු අතර ඉන් පාසල් කම්කරුවකුගේ දින 109 ½ක් වූ වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් රු.70,263 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුවට අයත් ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සේවය කරනු ලබන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වරින්වර සිදුකරන ලද වැටුප් ප්‍රතිශෝධනයන්ට අදාල වැටුප් පරිවර්තනයන් නියමිත පරිදි සිදුනොකිරීම හා ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් 2015 ජුලි 31 දිනට වූ ගෙවීමට ඇති හිඟ වැටුප් මුදල රු.1,212,431,862ක් විය. මෙම තත්ත්වය දකුණු පළාත් අධ්‍යාපන සේවාව තුළ සිටින කාර්ය මණ්ඩලයට සිදුවී ඇති අසාධාරණයක් බවත්, දකුණු පළාත් අධ්‍යාපන සේවාවේ ගුණාත්මක වර්ධනයට එය අහිතකර විය හැකි බවත් නිරීක්ෂණය විය.

(ආ) කලාප අධ්‍යාපන කාර්යාලය - හම්බන්තොට
-----------------------------------------------

(i) දකුණුපළාත්අධ්‍යාපනලේකම්ගේ 2013 මැයි 25 දිනැති ලිපිය මගින් මූලික විමර්ශනයකදී අනාවරණය වූ කරුණු අනුව ගුරුවරුන් හතර දෙනෙකු අනුප්‍රාප්තිකයින් සහිතව කලාපයේ වෙනත් පාසල් වෙත ස්ථාන මාරුකර වාර්තා කරන ලෙස දක්වා තිබුණි. එසේ වුවත්විමර්ශන නිර්දේශ ලබාදී වසර 02 ක් ඉක්මගොස් ඇතත්, විගණන දිනය වූ 2015 ජුනි 06 දින වන විටත් අදාල

ගුරුවරුන්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කිරිමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා පියවර ගෙන නොතිබුණි.

(ii) හම්බන්තොට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ 2012 මාර්තු 21 දිනැති ලිපිය ප්‍රකාරව මෙම විද්‍යාලයේ විදුහල්පතිවරයා වහාම ක්‍රියාත්මක වන පරිදි ජාතික පාසලක සේවය සඳහා අනුයුක්ත කර තිබුණි.2015 ජුනි මස විගණන අවස්ථාව වන විට අවුරුදු 03 මාස 02 ක් ඉක්ම ගොස් තිබුණද, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියටහිමිකම් කියන මෙකී නිලධාරියාඑකී ජාතික පාසලෙහි ගුරුවරයෙකු වශයෙන් කටයුතු කරන බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) ගාල්ල දිස්ත්‍රික්කය තුළ පැවති පළාත් පාලන ආයතන බලප්‍රදේශ වෙන්කර, 2000 සහ 2005 වර්ෂවලදී අළුතින් ස්ථාපනය කරන ලද හික්කඩුව නගර සභාව, රජගම ප්‍රාදේශීය සභාව, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව සහ ඉමදුව ප්‍රාදේශීය සභාව යන සභාවන් සඳහා වෙන්කර ඇති වත්කම් හා බැරකම් දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නීත්‍යානුකූලව පවරාදීමසිදු නොකිරීම නිසා සභාවන් තුළ පරිපාලනමය ගැටළු මෙන්ම ආදායම් අයකර ගැනීම පිළිබඳ ගැටළුද මතු වී තිබුණි.

(ඈ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

-----------------------------------------

(I)<u>රජයේ ඉඩම් සඳහා බලපත්‍ර නිකුත් කිරිම</u>

- විගණන දිනය වු 2015 ජුනි 09 දිනට ඉඩම් කච්චේරි පැවැත්වීමේ ප්‍රගතිය අනුව ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයන්ට අදාලව බලපත්‍ර ලබාදිම සඳහා අවසාන ලේඛනයට අනුමැතිය ලබාදී තිබු ප්‍රතිලාභීන් 1312 කින් 705 ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය.

- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිලාභින් සඳහා 2015 ජුනි 09 දින වනවිට කිසිදු බලපත්‍රයක් නිකුත් කර නොතිබුණු අතර එම දිස්ත්‍රික්කයට අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12න් බලපත්‍ර ලබාදීම සඳහා අවසන් අනුමැතියලබාදුන් ප්‍රතිලාභීන්ගේ නාමලේඛනය ඉදිරිපත් වුයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව පමණි. එම දිස්ත්‍රික්කයට අදාලව බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු තොරතුරක් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(II) <u>රම්මලකන්ද සංචාරක බංගලාව පරීක්ෂාව</u>

දෙපාර්තමේන්තුව සතු වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි රම්මලේ වරාපිටිය නම් ප්‍රදේශයෙහි අක්කර 2 ක භුමි ප්‍රදේශයක් තුළ පිහිටා තිබු රම්මලකන්ද සංචාරක බංගලාවටරාජ්‍ය නිලධාරීන් වරින් වර පැමිණ නවාතැන් පහසුකම් ලබාගෙන තිබුණද කිසිදු ගාස්තුවක් අයකර නොතිබුණි. බංගලාවෙහි භාරකරු වෙත 2012 අප්‍රේල් මස සිට 2015 ජුනි දක්වාරු.1,044,327 ක වැටුපක් ගෙවා තිබුණු අතර මෙම බංගලාවෙහි විදුලි වියදම ( 2013 සිට 2015 අප්‍රේල් දක්වා) රු.11,355 ක් විය. මෙලෙස දෙපාර්තමේන්තුව විසින් සංචාරක බංගලාව වෙනුවෙන් වියදම් දැරුවද කිසිදු ආදායමක් උපයා ගෙන නොමැති බවත් ආදායම් මාර්ග උත්පාදනය කර ගැනීම සඳහා දෙපර්තමේන්තුව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බවත් අනාවරණය විය.

(ඉ) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බදුකරුවන් 04 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු දීර්ඝකාලීන බදු වටිනාකම රු.391,578 ක්වු අතර ඉන් බදුකරුවන් දෙදෙනෙකුගේ බදු හිඟහිටි කාලසීමාව අවු.15ද ඉක්මවා තිබුණි. තවද වාර්ෂික අවසර පත්‍ර 147 ක් සම්බන්ධයෙන්ද 2014 දෙසැම්බර් 31 දිනට රු.1,183,888 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

(ඊ) රුහුණු සංචාරක කාර්යාංශය විසින් රු.3,919,025 ක වියදමක් දරා ඉදිකර තිබුණු දෙනියාය සංචාරක තොරතුරු මධ්‍යස්ථානය කොටපොල ප්‍රාදේශීය සභාවට අයත් වුවක් වූ අතර එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) කාර්මික සංවර්ධන අධිකාරිය
---------------------------------

බෙන්තොට ජනකලා කේන්ද්‍රයෙහි පිහිටි ගොඩනැගිලි 3 ක් බදුදීමෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.441,600 ක බදු මුදලක් මාස 2 ත් 16 ත් අතර කාලයක් අයකරගෙන නොතිබූ අතර ඒවා අයකර ගැනිම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඌ) 2014 ඔක්තෝබර් මාසයේදී ගාල්ල දිස්ත්‍රික් වාරිමාර්ග කාර්යාලයට භාරදී තිබූ ස්කැවේටර් යන්ත්‍ර 02 2014 දෙසැම්බර් 28 සහ 2015 අප්‍රේල් 02 අක්‍රිය වී තිබුනද එම යන්ත්‍ර දෙකෙහි යන්ත්‍ර ක්‍රියාකරුවන්ට සහ යන්ත්‍ර සහායකයන්ට වැටුප් වශයෙන් 2015 ජූලි මස දක්වා රු.735,304 ක මුදල් කිසිදු සේවාවක් ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි. එසේම දිස්ත්‍රික් වාරි කටයුතු සඳහා පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් ලබාගත් යන්ත්‍ර සඳහා 2014 වර්ෂය තුළදී රු.2,149,034 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් වාරිමාර්ග කාර්යාලය සතුව යන්ත්‍ර තිබුණද ඒවායින් නිසි ප්‍රයෝජනයක් ලබා නොගැනීම මත පෞද්ගලික අංශය වෙත රජයේ ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් වැයවී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

(එ) පරිවාස කොමසාරිස් කාර්යාලය, රුහුණු ළමා නිවාසය හා අනෙකුත් ළමා නිවාස පිහිටි භූමිය නොහොත් වාසලවලව්ව වත්ත නම් ඉඩම මධ්‍යම රජයේ පරිවාස දෙපාර්තමේන්තුවට පරිත්‍යාග කළ දේපලක් වන අතර, එය රජය සතු දේපලක් බවට පත්කර ගැනීමට ඉඩම් අත්පත් කර ගැනීමේ පනත් 38(ආ) අතුරු විධානය යටතේ කටයුතු කර නොමැති බව අනාවරණය විය.

(ඒ) හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
------------------------------------------------

(i) පෞද්ගලික ආයතන 3 ක් විසින් 2013, 2014 හා 2015 වර්ෂ සඳහා සුරා බදු බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

(ii) ලංකා සෝල්ට් ලිමිටඩ්හි මහලේවාය හා කොහොලංකල ලේවායේ බදුකරයන් වෙනුවෙන් 2012, 2013 හා 2014 වර්ෂ සඳහා රු.16,429,860 ක බදු හා දඩමුදලක් 2015 සැප්තැම්බර් 30දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඔ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මාතර
--------------------------------------

(i) මාතර දිස්ත්‍රික්කයේ විදුහලක 10, 11 ශ්‍රේණි සඳහා ඉගැන්වීමට නියමිත දෙවන කාණ්ඩයේ තාක්ෂණික විෂයයන් 9 කින් දෙකක්ද, 6 සිට 9 ශ්‍රේණි සඳහා නියමිත සෞන්දර්ය විෂයයන් අතුරින් එකක්ද පමණක් උගන්වා තිබූ බැවින් ශිෂ්‍යයින්ට විෂයයන් තෝරා ගැනීමට තිබූ අවස්ථාවන් අහිමිවී තිබුණි.මෙම විද්‍යාලයේ සිසුන් 150 ක් පමණ ඉගෙනුම ලබන නමුත් පිරිසිදු පානීය ජල පහසුකම් නොමැතිවීමෙන් සිසුන් හා ගුරුවරුන් දැඩි දුෂ්කරතාවයකට පත්ව තිබුණි. එමෙන්ම සිසුන්ගේ පරිහරණය සඳහා පාසල සතුව එකදු පරිගණකයක් හෝ නොතිබූ අතර විගණන දිනය වූ 2015 මාර්තු 16 වනවිටත් පරිගණක ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ii) වෙනත් අධ්‍යාපන කලාපවල සිට මාතර කලාපය වෙත 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ ස්ථාන මාරු ලැබූ ගුරුවරුන් 12 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු 2015 වර්ෂය වනවිටත් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) මාතර දිස්ත්‍රික්කයේ විද්‍යාලයකට අයත් අක්කර 04 රූඩ් 02 යි පර්චස් 26 ක් වන පාසල් ඉඩමේ මායිම් තාප්ප කිසිවක් නොතිබූ අතර පාසැල්ඉඩම අවට ගම්වාසීන් බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බවත් විගණනයේදී අනාවරණය විය.

(ඕ) නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - මාතර

2012 වර්ෂයේදී දෙයියන්දර රෝහල් භූමියේ සායන ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කර තිබූ අතර 2015 මාර්තු 31 දින විගණන අවස්ථාව වන විට එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නවතා දමා තිබුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් රෝහලේ ජල සැපයුමෙන් ජලය භාවිතා කර තිබූ අතර ඒ සඳහා රු.122,272 ක මුදලක් ඔහුගෙන් අයවීමට තිබුණද 2015 මාර්තු 31 දක්වා එම මුදල් අයකර නොතිබුණි.

(ක) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

(i) අධිකාරියට අයත් බස් නැවතුම්පලවල කඩකාමර 24 ක ගිවිසුම් කාලය අවසන්වී ඇතත් ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ii) 2015 මාර්තු විගණන පරීක්ෂාවේදී වදුරඹ බස් නැවතුම්පලේ කඩකාමර 4 ක් හා ඌරගස්මංහන්දිය බස් නැවතුම්පලේ කඩකාමර 02 ක් මාස 3ක කාලයක් අඛණ්ඩව ව්‍යාපාර කටයුතු සඳහා විවෘත නොකර වසාතබා ඇතත් ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ග) ප්‍රධාන ලේකම් කාර්යාලය

(i) දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ 261:2.4 රීතිය ප්‍රකාරව දෙන ලද අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් එලෙස අත්තිකාරම් පියවීමකින් තොරව දින 12 සිට දින 94 දක්වා කාලයක් මුදල් අතරඳවා ගෙන තිබුණි.

(ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරනරාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සෑම මාස 06 කට වරක් වාහනවල ඉන්ධන පරික්ෂණය කළයුතු වුවත් එවැනි ඉන්ධන පරික්ෂණයක් සිදුකර නොතිබුණි. 2014 දෙසැම්බර් 05 දිනැති අංක CSS/3/11/10 දරන ලිපිය මගින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සංචිත වාහන 14 ක ඉන්ධන පරික්ෂාව සිදුකර වාර්තාවක් ලබාදීමට සහකාර අධ්‍යක්ෂවරයෙකුගේ සහභාගීත්වයෙන් යුතු කමිටුවක් පත්කර ඇතත් 2015 අගෝස්තු 27 දක්වාඑම කටයුත්ත නිමකර වාර්තා කර නොතිබුණි.

(ච) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

(i) පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තිරණයක් අනුව අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ආධාර, වෛද්‍යාධාර, ශිෂ්‍යාධාර, ස්වයං රැකියා ආධාර, ක්‍රීඩා සමිති, දහම් පාසල්, ස්වේච්ඡා සංවිධාන හා සමිතිවලට ආධාර ලබාදීමේ විශේෂ වැඩසටහන පළාත් සභා ගරු මන්ත්‍රීවරුන් හරහා ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රධාන ලේකම් කාර්යාල වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 38ක් ලබාදීම අනුමත කර තිබුණි. මෙකී අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා දකුණු පළාත් ආණ්ඩුකාරතුමියගේ අනුමැතියක් ලැබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙවැනි වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන ලබාදුන් බවට සාක්ෂිද ඉදිරිපත් නොවීය. නමුත් උපමාන පාදක ප්‍රදාන හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ලබා දී ඇති අග්‍රිම භාවිතාකර ආණ්ඩු පක්ෂයේ පමණක් එක් මන්ත්‍රීවරයෙකු ලක්ෂ 10බැගින් වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

- මෙවැනි විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ලේකම්ගේ හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) ගේ අනුමැතියක් ලබා ගෙන නොතිබියදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

- මන්ත්‍රීවරුන් විසින් අදාල මුදල් ලබාදුන් බවට ප්‍රතිලාභීන්ගේ අත්සන් සහිතව ඉදිරිපත් කරන ලද නම් ලැයිස්තුවලට 2013 දෙසැම්බර් 31 දින දකුණු පළාත්

සංවර්ධන අධිකාරිය මගින් චෙක්පත් ලියා එකී චෙක්පත් අදාල මන්ත්‍රීවරුන්ට ලබාදී තිබුණි. මෙම චෙක්පත් 2014 ජනවාරි හා පෙබරවාරි මාසවල ප්‍රතිලාභීන්ට බෙදාදී තිබුණි.

- ආධාර ලබාදීම සඳහා තෝරාගත් පුද්ගලයින් අඩු ආදායම්ලාභී පුද්ගලයින් බව ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශිය ලේකම් විසින් සහතික කර නොතිබියදී මෙම ආධාර ලබාදී තිබුණි.

- මේ යටතේ මිල කැඳවීමකින් තොරව ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම සඳහා 2014 ජනවාරි මස රු.14,997,748ක් සහ අප්‍රේල් මස රු.798,340ක්ද ලෙස රු.15,796,088ක් පිළියන්දලප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. මෙහිදී ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන මුදල ඉක්මවා රු.596,088ක් ගෙවා තිබුණි.

(ii) ගාල්ල දිස්ත්‍රික්කයට අදාලව ව්‍යාපෘති 47ක්, මාතර දිස්ත්‍රික්කයට අදාලව ව්‍යාපෘති 14ක් හා හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාලව ව්‍යාපෘති 07ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දකුණු පළාත් සංවර්ධන අධිකාරියවෙත ලැබී තිබූ එකතුව රු.3,462,417ක ප්‍රතිපාදන මුදලක්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හා අදාල පළාත් සභා මන්ත්‍රීවරුන් 7වන පළාත් සභාවට තේරී පත් නොවීම හේතුවෙන් 2014 ඔක්තෝබර් 31 වන දින ප්‍රධාන ලේකම් වෙත ආපසු යවා තිබුණි.

(ජ) ගාල්ල කලාපයේ අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය තුළ "වෙනත්" ලෙස දක්වා තිබූ රු.9,402,800 ක ශේෂය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුව

යතුරුපැදි ණය ලබාගත් සභික ධූරය අතහැර ගිය හා මිය ගිය පළාත් පාලන ආයතන සභිකයින් 12 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතුව තිබූ රු.360,490 ක ණය ශේෂය අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණය වන ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි වාර්ෂික බදු, එලදා බදු, දිර්ඝකාලින බදු හා ගැණුම් මිල අයකිරීම් සම්බන්ධයෙන් 2014 වර්ෂයේදි රු.24,007,266 ක මුදලකින් බදු ඉලක්කයන් කරා ළඟා නොවී තිබූ බව නිරීක්ෂණය වූ අතර ඉහත බදු වර්ගයන් අතුරින් දීර්ඝකාලීන බදු අයකර ගැනීම ඉතා දුර්වල මට්ටමක පවතුණි.

## 6.3 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

**දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

පහත සඳහන් කරුණුනිරීක්ෂණය විය.

(අ) වෙහැල්ල - මාහරණ මාර්ගය පුළුල් කිරීම වෙනුවෙන් ජේ සී බී යන්ත්‍රයක් කුලී පදනම මත දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සේවයේ යොදවාගත් බවටඉදිරිපත්

කළ ලිපියක් මත අදාල කාර්ය සිදුකර ඇති බවට හා අදාල පැය ගණන හා රේටය පිළිබඳ කිසිදු පරීක්ෂා කිරීමකින් තොරව රු.469,350 ක් ගෙවා තිබුණි.

(ආ) දැයට කිරුළ මාර්ග සංවර්ධන වැඩ සටහන් යටතේ මාතර දිස්ත්‍රික්කයේ මාර්ග 09 ක් සඳහා ඒ බී සී මිශ්‍රගල් හා $C_1$ගල් සැපයීමට අදාලව කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ඇ) 2015 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රවේශ මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය වෙමින් පවතින මාර්ග 07 ක් සඳහා ඒ බී සී සැපයුම්කරුවන් වෙත රු.38,371,237 ක් ගෙවා තිබු බිල්පත් 14 කින් යුක්ත වු නියැදියක් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සැපයුම්කරුවන් කාර්මික නිලධාරීවරයාගේ උපදෙස් පරිදි මුට්ටකර මිණුම් ගැනීමකින් තොරව සෘජුවම ඒ බී සි මාර්ගවලට යොදා තිබෙන අතර, සැපයුම්කරුවන්ගේ ටිපර් රථ පැමිණීමේ වාර ගණන පදනම් කරගෙන අදාල ටිපර් රථයේ සම්මත ධාරිතාවය සැපයුම් ප්‍රමාණය සේ සලකා ඒ බී සී සැපයුම ගණනය කර තිබුණි.

(ii) ඒ බී සී මාර්ග සඳහා සැපයුම්කරුවන් විසින්මපත්කර තිබු වැඩ පරීක්ෂකයින් විසින් ටිපර් රථ අංකය , බෙදා හැරීමේ සටහන් අංක හා ටිපර් රථයේ සම්මත ධාරිතාවය සටහන් කර තිබු අතර එහි නිරවද්‍යතාවය පිණිස අධීක්ෂණ නිලධාරියෙකුගේ පරීක්ෂාවට ලක්වෙන ආකාරයේ විධිමත් වැඩපිළිවෙළක් අනුගමනය කර නොතිබුණි.

(iii) සැපයුම්කරුවන් විසින් සපයා තිබු ඒ බී සී මිශ්‍රණයේ යෝග්‍යතාවය පිළිබඳ පර්යේෂණාගාර වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සපයා තිබු ඒ බී සී මිශ්‍රණයේ යෝග්‍යතාවය පිළිබඳ විගණනයටපරීක්ෂා කිරීමට නොහැකි විය.

(iv) මාර්ග සඳහා පත් කර තිබු වැඩ පරීක්ෂකවරුන්ගෙන් ලබාගත් තොරතුරු මත පදනම්ව අදාල කාර්මික නිලධාරී විසින් ඒ බී සී සැපයුම් ප්‍රමාණය තහවුරුකර ගෙවීම් කර තිබු අතර මේ සඳහා පවත්වා තිබු තොග ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව සටහන් තබා නොතිබුණි.

(v) තෝරාගත් ගෙවීම් නියැදියට අනුව රු.29,652 ,237 ක් වටිනා බිල්පත්‍ර 09 ක් සඳහා ගෙවීම් කර තිබු සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹී නොතිබුණි. ඒ අනුව ඉහත මාර්ග 07 සංවර්ධනය වෙනුවෙන් ඒ බී සී සැපයුම් සඳහා ගෙවන ලද බිල්පත් වටිනාකම් වලින් සියයට 77.3 ක් ගෙවා තිබුණේ සැපයුම්කරුවන් සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව බව නිරීක්ෂණය විය.

(ඈ) දැයට කිරුළ පිවිසුම් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජේ සී බී යන්ත්‍ර කුලී පදනම මත ලබාගැනීම

(i) 2015 මාර්තු 04 විගණන දින වන විට ජේ සී බී යන්ත්‍ර සැපයුම්කරුවන් සඳහා වු ගෙවීම් තොරතුරු අනුව ජේ සී බී යන්ත්‍ර 20 ක් ව්‍යාපෘතියේ කටයුතු සඳහා යොදවාගෙන තිබුණත් විගණනය වෙත ඉදිරිපත් වුයේ ඉන් ජේ සී බී යන්ත්‍ර 03 ක ගිවිසුම් පමණි.

(ii) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයාගේ ව්‍යාපෘති ඉංජිනේරු ඇමතු ලිපි 03 ක් මගින් 2015 දැයට කිරුළ ප්‍රවේශ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වාහන හා යන්ත්‍ර සුත්‍ර යෙදවීමේදී ඒවා යෙදවුම් හා නිමවුම් පදනමමත යොදා ගන්නා ලෙස දන්වා තිබුණද එසේ සිදුකර තිබු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා යොදවාගත් ජේ සී බී යන්ත්‍ර අතුරින් එක් යන්ත්‍රයක ධාවන සටහන් පමණක් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.එම ධාවන සටහන්වල ඇතුළත් සමහර කරුණු අසත්‍ය බවට විගණනයේදී අනාවරණය වු හෙයින් ජේ සී බී යන්ත්‍ර 20 ක් සඳහා 2015 පෙබරවාරි 22 දින වන විට ගෙවීම් වවුචර් 49ක් මගින් ගෙවා ඇති රු.17,796,216 ක මුදල සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමට පත්විය නොහැකි විය.

(ඉ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වූ පළාත් මාර්ග හා නිම නොවූ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - මාතර

(i) මෙම මාර්ග ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර සූත්‍ර ලබාගැනීම හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී පළාත් අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩලයක් විසින් ගතයුතු ටෙන්ඩර් තීරණ පළාත් අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලය මගින් ගෙන තිබූ බව අනාවරණය විය. 2011 ජූනි 28 දින පැවති පළාත් අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩල රැස්වීමට සහභාගීවී තිබුණේ සාමාජිකයින් 3 දෙනෙකු පමණක් වූ අතර ප්‍රධාන ලේකම් කාර්යාලය නියෝජනය කරන ලද නිලධාරියා මෙම ටෙන්ඩර් තීරණයට අනුමැතිය ලබාදී නොතිබුණි.

(ii) හදිසි අවශ්‍යතාවය බව හඟවමින් මුල් අවස්ථාවේ විධිමත් අනුමැතියක් රහිතව සීමිත මිල කැඳවීම් මත සැපයුම්කරුවන් තෝරාගෙන තිබූ අතර, ව්‍යාපෘතියේ කටයුතු සිදුකරන අතරතුර විවෘත මිල කැඳවීමේ හැකියාවක් තිබියදී එසේ කටයුතු නොකර සීමිත මිලගණන් කැඳවීමට තීරණය කර තිබුණි. එහිදී අවම මිලගණන් යටතේ සැපයීම සිදුකර තිබූ පෞද්ගලික සමාගමෙන් මිල ගණන් කැඳවා නොතිබුණි.

(iii) 2011 ඔක්තෝබර් 03 දින විවෘත කරන ලද මිල ගණන් වලට අදාල දෙවන පිටපත ආයතනය තුළ ආරක්ෂිතව පැවතිය යුතු වුවත්, මෙහි දෙවන පිටපත විගණනය වෙත ඉදිරිපත් නොකෙරිණි. මේ අනුව ලැබී තිබුණු ඇතැම් මිල ගණන් වල කර ඇති සංශෝධනයන් පසුව සිදු කළ බවට වූ සැකය විගණනයේදී බැහැර කිරීමට නොහැකි විය.

(iv) දෙවන වර ටෙන්ඩර් කැඳවීමේදී අවශ්‍යකරන සම්පූර්ණ ඒ බී සී ප්‍රමාණය හෝ එක් එක් මාර්ගය සඳහා අවශ්‍ය ඒ බී සී ප්‍රමාණයන් සඳහන් කිරීමකින් තොරව මිලගණන් කැඳවා තිබුණි. මෙහිදී දිනකට සැපයිය යුතු ඒ බී සී ප්‍රමාණය මීටර් කියුබ් 500 ක් යන්න දක්වා තිබුණි. මෙය අමාත්‍යාංශ ටෙන්ඩර් සීමාව ඉක්මවීම වසන් කිරීමේ අරමුණින් සිදුකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) මෙම ව්‍යාපෘතියේ කටයුතු වලට අදාල කිසිඳු ලිපිගොනුවක් විධිමත් පරිදි නඩත්තු කර නොතිබූ අතර සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන බිල්පත් විස්තර සටහන් කරගන්නා ලද ලේඛනය හා අදාල බිල්පත් හා වවුචර් ගෙවීම් අංශයට පරීක්ෂාව සඳහා භාරදීමේදී සටහන් කරන ලද ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

(vi) මෙම ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව 2015 මාර්තු 17 දිනැති ලිපිය මගින් ඉල්ලන ලද සම්පූර්ණ තොරතුරු විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

## 6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පළාත් සභාවේ ආයතන විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී අනාවරණයවූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 54.4(1) ප්‍රකාරව ඉදිකිරීම් සහ සේවා කොන්ත්‍රාත් සඳහා ගෙවීම් සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයකට යටත්ව අත්තිකාරම් ගෙවිය හැකි වුවද, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 08 දින අංක HA – 5895දරන රථයේ අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම් කිරීමේදී කිසිඳු ගෙවීම් සුරක්ෂණයක් නොමැතිව මුළු ඇස්තමේන්තු මුදල වන රු.386,024 න් සියයට 62 ක පමණ එනම් රු.237,975 ක මුදලක් අත්තිකාරම් ලෙස මෝටර් රථ නියෝජිතායතනයක් වෙත ගෙවා තිබුණි. එසේම 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.13 ප්‍රකාරව ඉහත අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු මිල ගණන්වල සාධාරණත්වය සම්බන්ධයෙන් සුදුසුකම් ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක්ද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යවරයාට අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ රු.289,710 ක් වූ භාණ්ඩ නව පළාත් ඇමති මණ්ඩලය පත්වීමත් සමඟම ධූර කාලය නිමවීමෙන් පසුව අමාත්‍යාංශය වෙත භාරදිය යුතු වුවත් 2015 පෙබරවාරි විගණිත අවස්ථාව දක්වාම මෙම භාණ්ඩ භාරදී නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම, වාරිමාර්ග, ගොවිජන සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන සහ පරිසර කටයුතුඅමාත්‍යාංශය

---

අමාත්‍යාංශයේ ව්‍යාපාර නාම විෂයෙහි කටයුතු සහ එකී කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට බෙදාදීම සඳහා පරිගණක 48 ක් සහ මුද්‍රණ යන්ත්‍ර 48 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 26 දින ආයතන 08කින් මිල කැඳවුම් කර තිබුණු අතර එහිදී අදාළ භාණ්ඩ සති දෙකක් ඇතුළත සැපයිය යුතු බව මූලික කොන්දේසියක් ඇතුළත්වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පළාත් මුදල් රීති 422 (ආ) සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 2.14.1(3) ප්‍රකාරව රුපියල් මිලියන 02 කට අඩු ප්‍රසම්පාදනයන් සඳහා පමණක් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට තීරණ ගැනීමේ අධිකාරී බලය හිමි වුවද ඊට පටහැනිව මිල සැඳහුම් ක්‍රමය උපයෝගී කර ගනිමින් රු.3,525,600 ක් වූ මිලට ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක සාමාජිකයින් අතුරින් අවම වශයෙන් එක් සාමාජිකයෙකු හෝ අදාල විෂය සම්බන්ධයෙන් විශේෂඥයෙකු විය යුතු වුවද ඉහත මිලදී ගැනීම වෙනුවෙන් පත්කළ කමිටුවෙහි එවැනි සුදුසුකමක් ඇති සාමාජිකයෙකු නොවීය.

(iii) මිල කැඳවීම් ලිපියේ විශේෂ කරුණු යටතේ දක්වා ඇති පරිදි සති 02 ක් තුළ භාණ්ඩ සැපයිය යුතු විය. ඒ අනුව පරිගණක 48 2014 දෙසැම්බර් 23 දින වනවිට සපයා තිබිය යුතු වුවත් 2015 පෙබරවාරි 13 වන විගණිත දින ගබඩාව පරීක්ෂාවට ලක්වන අවස්ථාව වන විටත් සපයා තිබුණේ පරිගණක 27 ක් පමණි.

(iv) අමාත්‍යාංශය වෙත සියළු භාණ්ඩ නොලැබුනද මුදල් රෙගුලාසි 215(1) හා (1)(අ) ට පටහැනිව 2014 දෙසැම්බර් 31 දින රු.3,525,600 ක් වටිනාවෙක්පතක්නිකුත්කර අතරදවා ගෙන තිබුණි.

(v) අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමද සිදුකර නොතිබුණි.

(ඈ) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

---

(i) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් දකුණු පළාත් පාසල් සංගීත තරඟාවලියේ ජයග්‍රාහකයින්ට ප්‍රදානය කිරීම සඳහා සහතිකපත් 2450 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දින රු.64,925 ක මුදලක් ගෙවා තිබූ අතර 2014 මැයි 31 හා ජූනි 01 දිනයන්හි පැවති අදාල තරඟ සඳහා 2015 ජූලි 31 වන විටත් සහතිකපත් බෙදාදීමට කටයුතු කර නොතිබුණි.

(ii) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2013 'සිප්දොර අභිසෙස් ' වැඩසටහන යටතේ පිරිනැමීම සඳහා ඵලක හා කුසලාන සැපයීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දින රු.589,209කමුදලක්, අදාල භාණ්ඩගබඩාවටලැබීමට ප්‍රථම ගෙවා තිබූ අතර 2013 වර්ෂයට අදාල සම්මාන උත්සවය 2015 ජූලි 31 දින වනවිටත් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) දකුණු පළාත් තරුණ මධ්‍යස්ථානය හා ක්‍රීඩා පිටිය සකස් කිරීම සඳහා බද්දේගම වැකුණුගොඩවත්ත අක්කර 16 ක ඉඩම අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම වෙනුවෙන් 2001 මාර්තු 03 දින බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දකුණු පළාත් ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය වෙතින් ලද රු.800,000 ක චෙක්පත අදාල කාර්යය සඳහා යොදා නොගෙන පළාත් සභා පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කර තිබුණි.

(ඊ) ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඇත්තිලිගොඩ ප්‍රදේශයේ පුද්ගලයකු වෙත 1995 ජුනි 13 දින සිට අවුරුදු 30 ක කාලයක් සඳහා කෘෂිකාර්මික කටයුතු අරමුණු කරගෙන බදුදී තිබූ හෙක්ටයාර් 0.0107 වන රජයේ ඉඩමෙහි කිසිදු කෘෂිකාර්මික සංවර්ධනයක් සිදුකර නොතිබුණු අතර වසර 4 ක් සඳහා රු.115,684 ක බදු මුදලක් හිඟ හිට තිබුණි. රජයේ ඉඩමක් සම්බන්ධයෙන් වූ බදු ගිවිසුම කඩකර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

----------------------------------------

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි 2009 නොවැම්බර් 24 දිනැති අංක 4/10/24742 දරන ලිපිය පරිදි කෘෂිකාර්මික කටයුත්තක් සඳහා පුද්ගලයකුහට බදු දී තිබූ හෙක්ටයාර් 1.009 ක්වූ ඉඩම ඔහු විසින් කිසිඳු ගිවිසුමකින් තොරවම වෙනත් පුද්ගලයකුහට විකුණා තිබුණද ඒ සම්බන්යෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) ක්‍රීඩා, යෞවන කටයුතු ,ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන,සංචාරක, ආර්ථික, ප්‍රවර්ධන,
සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු , නිවාස හා ඉදිකිරීම්
සහ මිනිස්බල හා රැකිරක්ෂා අමාත්‍යාංශය

----------------------------------------------------------------------------------------------------

දකුණු පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරයකු ලෙස දැනට කටයුතුකරන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු 1990 සැප්තැම්බර් 10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයට පත්කර තිබුණි.එදින වැඩභාරගත් මොහු පුහුණුවෙන් පසුව 1990 සැප්තැම්බර් 27 සිට දකුණු පළාත් සභාවට අනුයුක්ත කර තිබුණද ඉන් මාස 9 කට පසු එනම් 1991 ජුනි 27 සේවයට වාර්තා කර තිබුණු බව අනාවරණය විය. නමුත් පත්වීම් බලධාරියා විසින් නියමිත දිනට සේවයට වාර්තා නොකිරීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම හා එම කාලය වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති සේ සලකා කටයුතු කරන ලෙස දන්වා තිබුණේ කුමන පදනමක් මතදැයි විගණනයේදී පැහැදිලි නොවීය.එසේම රාජ්‍ය සේවයේ වැටුප් රහිත නිවාඩු ලබමින් තවත් රජයට අනුබද්ධ ආයතනයක්වන විශ්ව විද්‍යාලයක 1991 ජූලි 27 තෙක් සේවය කර ඇති බව හා වැටුප් ලබා ඇති බව විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය.තවද මාස 9ක වැටුප් රහිත නිවාඩු කාලය දින 91ක් ලෙස ගලපා 1991 දෙසැම්බර් 09 දිනට පළමු වැටුප් වර්ධකයද ලබා දී තිබුණි.

(එ) 2011 අගෝස්තු 23 දින ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිකුත් කිරීමේ නියෝග පත් අටක් යටතේ දකුණු පළාත් සභා ඇමතිවරුන් හා මන්ත්‍රීවරුන් සඳහා බෙදාදීම පිණිස රු.7,920,000 ක් වටිනා ඩෙල් වර්ගයේ ලැප්ටොප් පරිගණක 55 ක් නිකුත් කර තිබුණද ඒ පිළිබඳ ලැබීම් නියෝග 2015 ජූලි 28 දක්වාත් ලබාගෙන නොතිබුණි.

(ඒ) <u>දකුණු පළාත් සංවර්ධන අධිකාරිය</u>

**(i)** සමාජ සේවා සංවිධානයක් සඳහා පුද්ගලික ඉඩමක් රජයට පවරාගැනීමකින් තොරව එහි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හා උපකරණ මිලදී ගැනීම සඳහා පළාත් සභා අරමුදලින් රු.6,500,000 කට ආසන්න මුදලක් අධිකාරිය විසින් වැය කර තිබුණි. ව්‍යාපෘති යෝජනාවට අදාලව සකස් කර තිබූ රු.4,825,000 ක ඇස්තමේන්තුව විධිමත් පරිදි සකස් කර අනුමත කර නොතිබූ අතර ඇස්තමේන්තු සැකසීම, කළවැඩ අධීක්ෂණය හා බිල් සකස් කිරීම කාර්මික නිලධාරියා විසින්ම සිදුකර තිබුණි. එසේම විධිමත් අධිකාරි බලයක් රහිතව මොහුට අවස්ථා දෙකකදී රු.107,862 ක් ගෙවා තිබුණි.

(ii) අධිකාරිය විසින් දකුණු පළාතේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් බෙදාදීම සඳහා පිටු 120 අභ්‍යාස පොත් 25000ක් සැපයීමට පෞද්ගලික සමාගමක්

වෙත රු.800,000ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම වැඩ යෝජනාව දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලයෙන් හෝ ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් අනුමත කර නොතිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ අභ්‍යාස පොත් 04ක සාම්පලය පරීක්ෂාවේදී මෙම පොත් සඳහා යොදා තිබූ ඇමුණුම් කටු ඉවත් කර නැවත ඇමුණුම් කර පිට කවර යොදා තිබූ බව නිරීක්ෂණය වූ අතර නොමිලයේ බෙදාදෙන මෙම අභ්‍යාස පොත්වල රු.50ක් ලෙස මිල සටහන් කිරීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න පැහැදිලි නොවීය. එසේම විගණිත දිනය වූ 2015 අගෝස්තු 06 වන විටත් බෙදාදී නොතිබුණු මෙම අභ්‍යාස පොත් තොගය විගණනයට ඉදිරිපත් කිරීමට අධිකාරිය හෝ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය අපොහොසත් විය.

(iii) මාතර දිස්ත්‍රික් සහභාගීත්ව සංවර්ධන ආයතනයේ වැඩ කටයුතු අවසන් වීමෙන් පසුව එහි පාලක මණ්ඩලය ගත් තීරණයක් මත රු.9,209,593 ක් 2008 අගෝස්තු 20 දින දකුණු පළාත් සභා අරමුදලට බැර කර තිබූ අතර මෙම මුදල් පළාතේ දුප්පත් දරුවන් සඳහා ශිෂ්‍යත්ව අරමුදලකට යොදා ගන්නා ලෙස එකී ආයතනය ඉල්ලා තිබුණි. 2011 ඔක්තෝබර් 25 දිනැති පළාත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම මුදල් දකුණු පළාතේ දරුවන්ගේ සෞඛ්‍ය, අධ්‍යාපන, ක්‍රීඩා වැනි ක්ෂේත්‍රවල සංවර්ධනය සඳහා ලබාදුන් මුදලක් ලෙස සලකා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් එකී අරමුණ සඳහා යොදා ගැනීමට තීරණය කර තිබුණි. මෙම මුදල ඇතුළුව එකතුව රු.9,446,927 කින් 2015 ජූලි 21 දින දක්වා රු.4,743,935 ක් සුභ පැතුම් මුද්‍රණය, පිරිත් ඇතුළත් සංයුක්ත තැටි, කාඩ්පත් හා නැලවිලි ගී පත්‍රිකා, විවිධ වර්ගයේ මුද්‍රිත පොත් සහ ලිපි ද්‍රව්‍ය ආදී විවිධ අයහාර ස්වරූපයේ වියදම් සඳහා අධිකාරිය වැය කර තිබුණු අතර රු.4,702,992ක් ඉතිරිව තිබුණි. මෙම මුදලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

- ගැබිණි මාතාවන් දැනුවත් කිරීමේ "සුවසෙත මෙහෙවර" වැඩසටහන සඳහා සහභාගීවන්නන්ට තිළිණ ලෙස ලබා දීමට පිරිත් ඇතුළත් සංයුක්ත තැටි, අංගුලිමාල පිරිත ඇතුළත් කාඩ්පත් හා නැළවිලි ගීත ඇතුළත් වර්ණවත් පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා අධිකාරිය විසින් රු.214,000ක මුදලක් වැය කර තිබුණි. පිරිත් ඇතුළත් සංයුක්ත තැටි මිලදී ගැනීම සඳහා ආයතන 4 කින් ලැබුණ මිල ගණන්හි ඇතුළත්ව තිබූ අදාල ආයතනවලදුරකථන අංක පරීක්ෂාවේදී ඒවා භාවිතයේ නොමැති අංක බව විගණනයට තහවුරු වූ අතර අක්‍රමවත් ආකාරයට ප්‍රධාන අමාත්‍ය කාර්යාලය මගින් ලබාගත් හෝ සකස්කළ මිල ගණන් අධිකාරියට ලැබී ඇති බවත්මිල ගණන් කැඳවීම් අධිකාරිය කළ බවට ව්‍යාජ ලිපි ලේඛනලිපි ගොනුවේ ඇතුළත් කර තිබූ බවත් අනාවරණය විය.

- දකුණු පළාත් අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල දැනට සේවයේ නියුතු හා විශ්‍රාමික නිලධාරීන්ට ඔවුන්ගේ උපන්දිනයන් වෙනුවෙන් සුභ පැතුම් එක් කිරීමට සුභ පැතුම් පත් හා ලිපි කවර 46,500 ක් මුද්‍රණය සඳහා අධිකාරිය විසින් රු.503,595 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.මීට අදාලව ප්‍රධාන අමාත්‍ය කාර්යාලය මගින් අක්‍රමවත් ආකාරයට සිදුකර තිබූ ප්‍රසම්පාදන කටයුතු ඇතුළු සියලු ගනුදෙනු වලට නීත්‍යානුකූල බවක් හිමිවන ආකාරයට අධිකාරිය විසින් ලිපිගොනුව පිළියෙළ කර තිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

- මෙම මුදලින් වියදම් දරා මුද්‍රණය කරන ලද පොත් සංයුක්ත තැටි ඇතුළු සියලුම ද්‍රව්‍යවල දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ තිළිණයක් ලෙස සඳහන් කර ලබා දී තිබුණු අතර මෙම ද්‍රව්‍ය මිලදී ගැනීමට රජයේ මුදල් වැය වූ බවට කිසිඳු සටහනක් ඒවායේ යොදා නොතිබුණි.

- ලේඛකයින් සඳහා ආධාර වශයෙන් රු.715,467ක වියදමක් දරමින් විවිධ වර්ගයේ පොත් 3190ක් මිලට ගෙන තිබූ අතර විගණිත දිනය වූ 2015 අගෝස්තු 06 වන විටත් ඒවා බෙදානොහැර ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ හා අධිකාරියේ තබා ඇති බවත් ලේඛිකාවක් වෙනුවෙන් මුද්‍රණ වියදම් සඳහා රු.28,000ක මුදලක් ද ලබා දී තිබූ බවත් අනාවරණය විය. මේ අනුව අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් ඵලදායි වැඩ සටහන් සිදුකළ හැකිව තිබියදී පෞද්ගලික ස්වරූපයේ වියදම් දැරීම හේතුවෙන් අදාල ප්‍රතිපාදන අරමුණට පටහැනි ලෙස භාවිතා කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය

(iv) ප්‍රධාන අමාත්‍යතුමාගේ වියදම් සඳහා වෙනමම වියදම් ශීර්ෂයක් යටතේ ප්‍රතිපාදන වෙන්කර තිබියදි ප්‍රධාන අමාත්‍ය නිල නිවසෙහි ගෙවත්ත සංවර්ධනය කිරීම වෙනුවෙන් අධිකාරියේ අරමුණු හා කාර්යයන්ට පටහැනිව, පොදු ගිණුම මගින් රු.311,520 ක වියදම් දරා තිබූ අතර ඒ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබූ බව නිරික්ෂණය විය.

(ඔ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
-------------------------------------------

(i) අධිකාරියේ සේවකයින්ගේ වැටුප් හා උසස්වීම් සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පරිදි වැටුප් පරිවර්තනයන් සිදුකර තිබුණි.

- 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මගින් ලබාදී ඇති වැටුප් වැඩිකිරීම් අධිකාරියේ සේවකයින්ට ගෙවීමට අදාලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2006 දෙසැම්බර් 26 දිනැති අංක DMS/B/03/01/03/01/ SA දරන ලිපිය මගින් ලබාදී ඇති නිර්දේශ වලට පටහැනිව වැටුප් පරිවර්තනයක් සිදු කර තිබුණි.

- විධිමත් අනුමැතියක් රහිතව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සියලුම මාණ්ඩලික නොවන සේවකයින් වෙත 2008 ජූලි 01 සිට වැටුප් වර්ධක 4 ක වැටුප් වැඩිවීමක් ලබාදී තිබුණි.

- 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 , මැයි 26 දිනැති අංක 28(1), අගෝස්තු 1 දිනැති අංක 28(11), 2007 අගෝස්තු 01 දිනැති අංක 36 හා 2007 ඔක්තෝබර් 15 දිනැති අංක 36(1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන හා 1990 මාර්තු 09 දිනැති අංක 15/90 , ජුනි 15 දිනැති අංක 15/90(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට පටහැනිව 2006 ජනවාරි 01 සිට 2012 ජනවාරි දක්වා සේවකයින් 60 ක් බඳවා ගෙන තිබුණි.

(ii) අධිකාරිය මගින් 2013 ජනවාරි සිට 2014 නොවැම්බර් දක්වා අනියම් කම්කරුවන් 21 ක් බඳවාගෙන ඔවුන් දකුණු පළාත් අධ්‍යාපන ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග, ප්‍රවෘත්ති අමාත්‍යවරයා වෙත මුදාහැර තිබුණි. අධිකාරියට අදාල කිසිදු රාජකාරියක් ඉටුකර නොතිබියදී ඔවුන්ගේ වැටුප් වශයෙන් 2015 මැයි අවසානයට රු.5,458,179 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

## 6.5 දෘශ්‍ය අක්‍රමිකතා
---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
-----------------------------------------------

අවස්ථා 04 කදී පැවති විවිධ උත්සව කටයුතු සඳහා දැරූ වියදම් වෙනුවෙන් රු.443,812 ක මුදලක් ආණ්ඩුකාරතුමිය වෙත ප්‍රතිපූර්ණය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ඉහත සියළු උත්සව කටයුතු සඳහා පූර්ව ඇස්තමේන්තු සකස් කිරීමක් හෝ පළාත් මුදල් රීති 418 ප්‍රකාරව දක්වා ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමකින් තොරව වියදම් දරා තිබුණු අතරඋත්සවය සඳහා සහභාගී වූ සංඛ්‍යාව පිළිබඳ අවධානයකින් තොරව වියදම් දරා ඇති බව නිරීක්ෂණය විය. එසේම අදාළ ගෙවීම් සිදුකිරීමේදී පළාත් මුදල් රීති 84, 85 හා 86 අනුව කටයුතු කර නොතිබුණි.

(ii) "සම්මාහිමානී"ධර්ම දේශනා වැඩසටහන වෙනුවෙන් රු.100,000 ක වියදමින් කිරිපැකට් 4000 ක් නියෝජිත වෙළෙඳසැළකින් ලබාගත් බවට ඉදිරිපත් කර තිබූ බිල්පත සම්බන්ධයෙන් එම ආයතනයේ අයිතිකරු විසින් 2015 ජූනි 12 දින විගණනයට ඉදිරිපත් කර ඇති ප්‍රකාශයට අනුව ඔහු ආණ්ඩුකාර ලේකම් කාර්යාලය වෙත කිරි පැකට් විකිණීමක් සිදු නොකළ බවත් එදිනට ඔහු සතුව පැවති තොගය අනුව කිසිලෙසකින්වත් එවැනි තොගයක් සැපයීම සිදුකළ නොහැකි බවත් සඳහන් කර තිබුණි.

(iii) එසේම තවත් ව්‍යාපාරික ස්ථානයකින් ඉහත වැඩසටහන වෙනුවෙන්ම රු.100,000 ක වියදමින් මාළුපාන් 4000 ක් ලබාගත් බව සඳහන්ව තිබුණි. අදාළ වෙළෙඳසැළේ අයිතිකරු විසින් 2015 මැයි 18 දින විගණනයට ඉදිරිපත්කර ඇති ප්‍රකාශය අනුව ඔහු කිසිදුවිටෙක එවැනි බිල්පතක් නිකුත් කිරීම හෝ භාණ්ඩ සැපයීමක් සිදු නොකළ බව සඳහන් කර තිබුණි.

(iv) ලබුදූව හා වැලිගම පැවති ගුරු උපහාර උළෙලවල් දෙක සහ"කලාව රසවිඳීමේ කලාව" නමැති වැඩමුළුව සඳහා දැරූ වියදම් ලෙස ප්‍රතිපූර්ණය කර තිබූ රු.252,762 ක වියදම තුළ ඇතුළත් රු.125,000 ක් වූ දිවා ආහාර පාර්සල් සඳහා වූ වියදම පිළිබඳ පරීක්ෂාවේදී ආයතන 03 කින් ඉදිරිපත් කළ බිල්පත් වල සඳහන් ලිපිනයන් හා දුරකථන අංක ව්‍යාජ ඒවා බවත් එවැනි ව්‍යාපාර එම ලිපිනයන්හි නොමැති බවත් අනාවරණය විය.

(v) වැලිගම පැවති උත්සවය සඳහා රු.80,812 ක් දරා මාළුපාන් හා කිරි පැකට් මිලදී ගැනීම කොළඹ සහ කුණ්ඩසාලේ යන ප්‍රදේශවල පිහිටි වෙළෙඳසැල් දෙකකින් සිදුකර තිබුණි. වැලිගම ප්‍රදේශයෙන් හෝ ආසන්න ප්‍රදේශයකින් අදාළ ද්‍රව්‍ය ලබා ගැනීමට හැකියාව තිබියදී ඉහත පරිදි දුරබැහැර ප්‍රදේශයකින් මිලදී ගැනීමට තුඩුදුන් හේතුන් මොනවාදැයි විගණනයේදී පැහැදිලි නොවිය.

(vi) එසේම ඉහත උත්සව සඳහා ශබ්ද විකාශන සැපයීම සඳහා රු.14,000 ක් ගෙවූ බවට වූබිල්පත්‍රයේ සඳහන් ලිපිනය හා දුරකථන අංක ද සාවද්‍ය බව තහවුරු විය.

(ආ) "සුභ දකුණක් දිනූ ජයග්‍රහණ රැකගනිමු" යන තේමාව යටතේ 2015 වර්ෂය වෙනුවෙන් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව සුභ පැතුම් පත් 380,000ක් මුද්‍රණය කර 2015 ජනවාරි 08 දින පැවති ජනාධිපතිවරණයට දින දෙකට පෙර දකුණු පළාතේ සියලුම පාසල් සිසුන් වෙත බෙදාදී තිබුණි. දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග, ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2014 දෙසැම්බර් 31 දිනැති ලිපිය මගින් අදාල සුභ පැතුම්පත් සිසුන්ගේ දෙමව්පියන් අතට පත්වන බවට පුද්ගලිකව සෑහීමකට පත්විය යුතු බව සියළුම විදුහල්පතිවරුන් වෙත දන්වා යවා තිබුණි.

(ඇ) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
-----------------------------------------------

(i) ගාල්ල දිස්ත්‍රික්කයේ කනිෂ්ඨ විද්‍යාලයක සේවයේ නියුතු උපගුරුවරයෙකු ඉදිරිපත් කළ ව්‍යාජ වැටුප් විස්තරයක් පදනම් කරගෙන 2008 ඔක්තෝබර් සිට 2013 අප්‍රේල් දක්වා රු.454,140 ක වැටුප් හා රු.23,969 ක විශේෂ දීමනාවක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි.

(ii) ව්‍යාජ ස්ථාන මාරු ලිපි හා සහතික පත්‍ර මගින් දකුණු පළාත් ගුරු සේවයට ඇතුළත් වී වංචනික ලෙස වැටුප් ලබාගත් ගුරුවරුන් 7 දෙනෙකුට අදාලව පැවති විනය පරීක්ෂණ අවසන් කර නොතිබූ අතර ඔවුන් විසින් වැටුප් හා දීමනා වශයෙන් ලබාගෙන තිබූ රු.3,707,024 ක මුදල ද නැවත අයකර ගෙන නොතිබුණි.

(iii) දෙපාර්තමේන්තුවට අනුයුක්ත රියදුරු මහතකු 2006 වර්ෂයේ සිට ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කර තිබූ අතර තම නිත්‍ය සේවා ස්ථානයේ පැමිණීම,

පිටවීම අත්සන් කිරීමකින් හෝ කිසිදු රාජකාරියක් ඉටුනොකර සිටියදී ඔහුට වැටුප් ලෙස රු.1,994,197ක් ගෙවා තිබුණි.

(ඇ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
-----------------------------------------

දෙපාර්තමේන්තුව සතුවාහන 3ක් පරික්ෂාවේදී මයිලෝ මීටරයේ අගයන් හා ධාවන සටහන් අතර පිළිවෙලින් කි.මි. 6820 ක්, 387 ක් හා 498 ක් වශයෙන් වෙනස්කම් නිරික්ෂණය වු අතර මෙහිදි ධාවනය නොකළ දුර ප්‍රමාණයන් වෙනුවෙන් ලබාගත් ඉන්ධනවල වෙළඳපල වටිනාකම රු.111,600 ක් පමණ විය. තවද මීන්වාහන දෙකකධාවන සටහන් වල විගණනය විසින් කොළ පැහැයෙන් සටහන් කර එම අවස්ථාවේදීම රියදුරුගෙන්ද අත්සන ලබාගත් මයිලෝ මීටරවල සටහන් සාවද්‍ය ලෙස වෙනස් කර තිබුණි.

(ඉ) දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
-----------------------------------------

දෙපාර්තමේන්තුව සතු වෙන්කළ වාහනයේ ඉන්ධන පාරිභෝජනය අනුව 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ලබාදිය යුතු ඉන්ධන ප්‍රමාණයට වඩා ඉන්ධන ලීටර් 218 ක් වැඩිපුර ලබාදී තිබු අතර එම ඉන්ධන ප්‍රමාණයේ වටිනාකම රු.35,425 ක් විය.

(ඊ) රුහුණු සංචාරක කාර්යාංශය
-------------------------------

කාර්යාංශයට අයත් මහජන බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුමේ2013 වර්ෂයේ සිට සාමාන්‍යයෙන් රුපියල් මිලියනයකට ආසන්න මුදලක් රඳවාගෙන තිබු අතර ලංකා බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුමේ රුපියල් මිලියන10 ඉක්මවු මුදලක් රඳවාගෙන තිබු නමුත් ඒවා ආයෝජනය කිරීමෙන් කාර්යාංශයට ප්‍රතිලාභයක් ලබාගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(උ) මාතර දිස්ත්‍රික්කයේ කනිටු විදුහලකපාසල් කාර්ය සහායක ලෙස 2013 ඔක්තෝබර් 14 සිට පත්වීම් ලද කොටපොල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු එදින සිට 2015 පෙබරවාරි 28 දින දක්වා කාලය තුළදී විද්‍යාලයට පැමිණ තිබුණේ දින 02 ක් පමණි. විද්‍යාලයෙන් 2013 නොවැම්බර් මස සිට 2015 මාර්තු විගණිත අවස්ථාව දක්වා රු.406,798 ක් වැටුප් වශයෙන් ලබාගෙන තිබු අතර එම කාලපරිච්ඡේදය සඳහා කොටපොල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් රු.135,000 ක මුදලක්ද මන්ත්‍රී දීමනා ලෙස ලබාගෙන තිබුණි. මෙම සේවා කාලය තුළ දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට සහ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට තාවකාලිකව අනුයුක්ත කර තිබුණු මෙම නිලධාරියාට දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයෙන් නිශ්චිත රාජකාරියක් පවරා නොතිබුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශය තුළද ඉටුකළ විශේෂ ව්‍යාපෘතිය කුමක්ද යන්න තහවුරු නොවීය.

(ඌ) ප්‍රධාන ලේකම් කාර්යාලය
------------------------------

2013 ජුනි 10 දින පැවති වාහන වෙන්දේසියේදී වාහන දෙකක්රු.2,476,500 කටඅලෙවි වී තිබුණි. නමුත් මෙම වාහනවල වැසි අංක වෙනස් කර ඇති බව පසුව අනාවරණයවීම නිසා එම මුදල් ගැණුම් කරුවන්ට ආපසු ගෙවා වාහන නැවත ලබාගෙන තිබුණි. මෙම අක්‍රමිකතාවය පිළිබඳ සොයා බලා වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධයෙන් පියවර ගැනීමට 2015 අගෝස්තු මාසය දක්වා කටයුතු කර නොතිබුණි.

(එ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
-------------------------------------------

(i) කැකණදුර රත්මලේ දික්වැල්ල මාර්ගය වෙත 2014 දෙසැම්බර් 01 සිට 31 දක්වා ඒ බී සී මිශ්‍රගල් කියුබික් මීටර් 01 ක් රු.2,900 ක් බැගින් සපයා තිබු අතර, 2015 ජනවාරි 01 දින සිට කියුබික් මීටර් 01 ක් රු.3,400 බැගින් සපයා තිබුණි. එසේ වුවත්, අධිකාරියඑක් පෞද්ගලික ආයතනයක් විසින් 2014 දෙසැම්බර් මස සපයන ලද ඒ බී සී මිශ්‍රගල් කියුබික් මීටර් 1 ක් සඳහා රු.3,395 ක් බැගින්ද තවත් පෞද්ගලික ආයතනයක් විසින් 2014 දෙසැම්බර් මස සපයන ලද ඒ බී සී මිශ්‍රගල් කියුබික් මීටර් 01 ක් සඳහා රු.3,400

බැගින්ද ගෙවා තිබුණි. ඒ අනුව 2015 පෙබරවාරි 24 වන විට 2014 දෙසැම්බර් මාසය තුළ සපයා තිබූණු ඒ බී සී වෙනුවෙන් රු.1,321,394 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) 2015 දැයට කිරුළ ප්‍රවේශ මාර්ගයක් වන ඕගස්පේ, අත්තුඩාව, නාදුගල මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා 2014 දෙසැම්බර් 31 වන විට පෞද්ගලික ආයතනයක් විසින් ඒ බී සී මීටර් කියුබ් 718.11 ක් මීටර් කියුබික් 01 ක් රු.2,900 බැගින් සපයා තිබුණි. ඒ අනුව මෙම සැපයුම්කරු වෙත ගෙවිය යුතුව තිබුණේ රු.2,082,519 ක් වුවත් රු.2,197,000 ක් ගෙවා තිබූ හෙයින් රු.114,481 ක් වැඩිපුර ගෙවා ඇති බව අනාවරණය විය.

(ඒ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

---------------------------------------

(i) දෙල්පෝන පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතා හේතුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු.208,790ක මුදල නැවත අයකර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් දැනුම් දී තිබුණද ඉන් රු.50,000ක් පමණක් අයකරගෙන තිබූ අතර ඉතිරි මුදල් අයකරගෙන නොතිබුණි. මීට අමතරව 2015 ජනවාරි 20 දිනැති විගණන විමසුමමගින් අනාවරණය කරතිබූ යන්ත්‍රවල සේවාව වෙනුවෙන් වැඩිපුර ගෙවා ඇති රු.172,000 ක මුදලද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අධිකාරිය මගින් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ පුස්තකාල සඳහා ලබාදීමට 2014 වර්ෂයේදීමිලදී ගෙන තිබූ රු.192,375ක් වටිනා වානේ අල්මාරි 15ක් බෙදාහැර ඇති ආකාරය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

## 6.6 අරමුදල් ඌන උපයෝජනය

-------------------------------

(අ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ඇතිව අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල තැන්පත් කළ හැකි වුවද ගාල්ල දිස්ත්‍රික්කයේ බාලිකා විද්‍යාලයකබැංකු ජංගම ගිණුම් දෙකක රු.12,554,111 ක මුදලක්2014 ජුනි සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

-------------------------------------

(i) ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරියට ලබා දෙන ලද රු.40,523,827ක් අවම පොලී අනුපාතයක් යටතේ වසර 2 කට අධික කාලයක් ඉතුරුම් ගිණුමක රඳවාගෙන තිබුණි.

(ii) අධිකාරියේ මන්ත්‍රී ප්‍රතිපාදන වලට අදාලබැංකු ජංගම ගිණුමේ 2014 ජනවාරි 01 දිනට රු.38,678,272 ක ශේෂයක් වූ අතර 2014 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.49,182,044 ක් වුයෙන්එහි සාමාන්‍ය ශේෂය රු.43,930,158 ක් විය. පළාත් සභාව මගින් ප්‍රාග්ධන වැය විෂයයන්ට හර කරමින් ලබාදී ඇති මුදල් මේ ආකාරයට ජංගම ගිණුම් තුළ රඳවා තැබීම නිෂ්ඵල කාර්යයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6.7 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

--------------------------------------------

(i) 2012 වාර්ෂික සැලැස්ම යටතේ පෙර පාසල් 10 ක් සඳහා බෙදාදීමට 2013 ජනවාරි 23 මිලදී ගෙන තිබුණුරු.148,191 ක් වටිනා පෙර පාසල් උපකරණ බෙදා නොහැර වර්ෂ 02කට අධික කාලයක් ගබඩාවේ තබාගෙන තිබුණි.

(ii) පහත දක්වා ඇති පරිදි කලාපකාර්යාල08 කට අදාල වසා දමා තිබූ පාසල් 104 ක් අතරින් පාසල් 51 ක් කිසිඳු කාර්යක් සඳහා භාවිතයට ගෙන නොතිබුණු අතර ඊට අයත් ගොඩනැගිලි 102 ක් හා අක්කර 72 රූඩ් 03 පර්චස් 29 ක පමණ ඉඩම් ප්‍රමාණයක් නිෂ්ක්‍රීයව පැවතුණි. ඇල්පිටිය කලාපයට අයත් වසාදමා තිබූ පාසලක එක් ගොඩනැගිල්ලක් ප්‍රදේශවාසින් දෙදෙනෙකු විසින් අනවසරයෙන් අත්පත් කර ගෙන තිබුණි.

| කලාපය | වසා දමා ඇති පාසල් ගණන | කිසිඳු කාර්යයකට යොදා නොගත් | | |
|---|---|---|---|---|
| | | පාසැල් ගණන | ගොඩනැගිලි ගණන | ඉඩම්ප්‍රමාණය |
| ගාල්ල | 32 | 10 | 17 | අක්කර 03 රූඩ් 03 පමණ |
| ඇල්පිටිය | 21 | 12 | 22 | අක්කර 22 පමණ |
| මාතර | 17 | 08 | 08 | අක්කර 04 රූඩ් 01 පර්චස් 32 |
| අකුරැස්ස | 07 | - | - | - |
| වලස්මුල්ල | 08 | 05 | 10 | අක්කර 09 රූඩ් 02 පර්චස් 19 |
| දෙනියාය | 01 | 01 | 02 | අක්කර 05 |
| හම්බන්තොට | 06 | 03 | 07 | අක්කර 05 |
| මුලටියන | 12 | 12 | 36 | අක්කර 23 රූඩ් 00 පර්චස් 18 |
| | 104 | 51 | 102 | අක්කර 72 රූඩ් 03 පර්චස් 29 |

(ආ) උඩුගමකලාප අධ්‍යාපන කාර්යාලය

(i) කාර්යාලයේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය අළුත්වැඩියාව සඳහා රු.20,048 ක් ගෙවා තිබුණද විගණන දිනය වු 2014 දෙසැම්බර් 11 වන විට මාස 07ක කාලයක්එම දුරකථන පද්ධතිය අක්‍රීයව පැවතුණි.

(ii) ධාවනයෙන් තොරව ආයතනයේ ගාල් කරතිබූ වෑන් රථය සඳහා රු.58,520 ක අළුත්වැඩියා වියදමක් දරා තිබූ අතර කිසිඳු කාර්ය පැවරීමකින් තොරව 2014 ජනවාරි සිට නොවැම්බර් දක්වාවූ එම කාලය සඳහා රියදුරුට රු.283,935 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික්කයේ මහා විද්‍යාලයක් සතු වර්ග අඩි 8500 ක් වු ගොඩනැගිලි 09 ක් ගරා වැටෙමින් පැවති නිසා වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) රුහුණු සංචාරක කාර්යාංශය

(i) දෙනුවල සංචාරක විවේකාංගනය ඉදිකිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.15,364,785 ක මුදලක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිලි සහ ලිබඩු උපකරණ නිෂ්කාර්යව පැවති අතර ඒවා සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා කිසිඳු දායකත්වයක් ලබා දී නොතිබුණි.

(ii) සමුද්‍ර පුරාවිද්‍යා සංචාරක නියමු ව්‍යාපාතිය සඳහා කාර්යාංශය විසින් 2014 වර්ෂය අවසානය දක්වා රු.6,335,326 ක මුදලක් වියදම් කර ඇති නමුත් 2015 ජනවාරි මාසය වනවිට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි.

(iii) රුහුණු අභිමංසල ව්‍යාපෘතිය සඳහා රු. 66,402,253 ක් ඇස්තමේන්තු කර තිබූ අතර 2010 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් දක්වා රු.47,722,156 ක් සහ ආරක්ෂක වියදම් ලෙස රු. 215,900 ක් වියදම් කර තිබූ නමුත් 2015 ජනවාරි මාසයේ විගණන අවස්ථාව වනවිටත් ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.

(ඉ) නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - මාතර

(i) දෙනියාය රෝහලට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අල්ට්‍රා සවුන්ඩ් ස්කැනර් යන්ත්‍රය හා එක්ස් රේ යන්ත්‍රය භාවිතයෙන් තොරව පැවතුණි.

(ii) මොරවක දිසා රෝහල වෙත 2006 මාර්තු මාසයේදී පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබුණු කිලෝ වොට් 35 ධාරිතාවයෙන් යුතු විදුලි ජනන යන්ත්‍රය 2014 නොවැම්බර් 11 දින වනවිට අක්‍රිය තත්ත්වයට පත්වී වසර කිහිපයක් ගතවී තිබුණි.විදුලිජනන යන්ත්‍රය රෝහලට අත්‍යවශ්‍ය උපකරණයක්ව තිබියදීත් එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2012 වර්ෂයේදී රු.1,164,350 ක් වැයකර අළුත්වැඩියා කරන ලද අංක 31- 9396 දරන ජීප් රථය අළුත්වැඩියාවෙන් පසුව ධාවනය කර නොතිබියදී 2014 සැප්තැම්බර් 30 දින පැවැත්වූ වෙන්දේසියේදී වෙන්දේසි කිරීමට යෝජිතව තිබුණි. ඒ සම්බන්ධයෙන් 2014 සැප්තැම්බර් 29 දින නිකුත් කරන ලද විගණන විමසුම හේතුවෙන් මෙම වාහනය වෙන්දේසියෙන් ඉවත් කර 2014 ඔක්තෝබර් 21 දින රුහුණු සංචාරක කාර්යාංශයට නැවත යවා තිබුණි. නමුත් 2015 අගෝස්තු 31 දක්වාත් මෙම වාහනය නිෂ්ක්‍රීයව පැවති බව විගණනයේදී අනාවරණය විය.

## 6.8 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

2014 සැප්තැම්බර් 11 දින ප්‍රධාන ලේකම් ඇතුළු සාමාජිකයන් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් දකුණු පළාත පිළිබඳව ග්‍රන්ථයක් නිර්මාණය කිරීමට හා ඒ සම්බන්ධ සියලු කටයුතු පුද්ගලයෙකුහට පැවරීමට තීරණය කර තිබුණි. මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පොත් මුද්‍රණය සඳහා රු.4,250,129 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කිරීමකින් තොරව වියදම් කර තිබුණි.

(ii) පොතේ මුද්‍රණය කටයුතු සම්බන්ධයෙන් 2014 සැප්තැම්බර් 22 දින එකී පුද්ගලයා සහ ප්‍රධාන ලේකම් අතර ඇතිවූ ගිවිසුම ප්‍රකාර පොතේ මුළුපිටපත් සංඛ්‍යාව වූ පොත් 500 න් 150 ක් කතෘ භාගය ලෙස ලබාදීමට එකඟ වී තිබුණු අතර එහි පිරිවැය රු.1,275,000 ක් විය. නමුත් එකී පිරිවැය සම්බන්ධයෙන් හෝ පොතෙහි අයිතිය සහ පොත මුද්‍රණය කිරීමේ අරමුණ ආදී වැදගත් කරුණු ගිවිසුමට ඇතුළත් නොවීය.

(iii) ගිවිසුම ප්‍රකාර මුළු පිරිවැයෙන් සියයට 25 ක් වූ අවසාන ගෙවීම සියළු ග්‍රන්ථ ලැබීමෙන් අනතුරුව සිදුකළ යුතු වුවද ඊට පටහැනිව 2014 දෙසැම්බර් 31 වනවිට සියළු ගෙවීම් කර තිබුනමුත් ඉතිරි පොත් 350 ලැබී තිබුණේ 2015 පෙබරවාරි 27 දින විය.

(iv) ඒ අනුව පොතක් සඳහා රු.12,143 ක් වූ අධික පිරිවැයක් දරාතිබූ අතර විගණිත දිනය වූ 2015 මැයි මස 06 වන විටත් මෙම පොත් ගබඩා කර තිබූ හෙයින් මේ සඳහා දරන ලද රු.4,250,129 ක් වූ වියදම අනාර්ථික වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
--------------------------------------------

ආයතනයේ නිලධාරින් 57 දෙනෙකු වෙනුවෙන් නුවරඑළිය ප්‍රදේශයේ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම සඳහා රු.341,000 ක මුදලක් වැයකර තිබුණි. මේ සඳහා ආයතනයේ නිලධාරීන්ම සම්පත් දායකයන් ලෙස යොදාගෙන තිබුණු අතර ගමනාගමනය සඳහා පෞද්ගලික බස්රථ 3 කට අමතරව ආයතනයේ සංචිත වාහනයක්දයොදාගෙන තිබුණි. දකුණු පළාත තුළ පුහුණු වැඩ සටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් තිබියදී දුරබැහැර ප්‍රදේශයක මෙවැනි වැඩ මුළුවක් පැවැත්වීමට හේතුන් කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) දකුණු පළාත් ධීවර,සංස්කෘතික, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
--------------------------------------------------------------------------------------------------

අමාත්‍යාංශයට අයත් ජීප් රථයක්කාර්මික දෝෂයක් හේතුවෙන් මොණරාගල ප්‍රදේශයේදී ක්‍රියා විරහිත වීම නිසා 2014 අගෝස්තු 11 දින ලැබුණු බවට දින මුද්‍රාව යොදා ඇති, දින රහිත ලිපියට අනුව මසකට රු.200,000 ක් බැගින් ගෙවා ජීප් රථයක් කුළී පදනම මත ලබා ගැනීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. අමාත්‍යාංශය සතුව සංචිත වාහන 03 ක් තිබියදීත් කුළී පදනම මත මාස 4 ක් සඳහා රු.800,000 ක් මෙම වාහනය වෙනුවෙන් ගෙවා ඇති බව නිරීක්ෂණය වූ අතර මෙකී කාලයට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - මාතර
----------------------------------------------------------------

(i) කැකණදුර ගොවිපලේ බීජ රක්නාගාරය සඳහා විදුලිජනන යන්ත්‍රයක් මිලදී ගැනීමට 2014අගෝස්තු 20 දින රු.1,220,240 ක්ද, යන්ත්‍රය ප්‍රවාහනය, කේබලය සවිකිරීම හා පරීක්ෂාව සඳහා රු.92,680 ක් ද ප්‍රසම්පාදන කමිටු අනුමැතියක් රහිතව 2014 නොවැම්බර් 11 දින ගෙවා තිබුණි. 2013 දෙසැම්බර් 31 වනවිට අදාල යන්ත්‍රය ගොවිපලෙහි ස්ථාපිත කර ඇතත් 2014 ජුනි 10 සිට බීජ රක්නාගාරය වසා දමා තිබූ බැවින් දරන ලද රු.1,312,920 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ii) කැකණදුර ගොවිපලේ කුකුළු කූඩු 06 ක් අළුත්වැඩියාව සඳහා රු.2,000,578 ක් වටිනා ඇස්තමේන්තු 06 ක් මාතර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර තිබුණද ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැතිවූ බැවින් පළාත් සංවර්ධන ව්‍යාපෘති යටතේ රු.200,000 ක මුදලක් අමාත්‍යාංශ ලේකම් විසින් ලබාදී තිබුණි. ඒ අනුව මේ සඳහා 2014 දෙසැම්බර් මාසය වන විට රු.197,916 ක් ගෙවා තිබුණි. අදාළ කුකුළු කූඩු නිසි ප්‍රමිතියට අනුව ඉදිකර නොතිබූ අතර එම කූඩුප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබූ බැවින් ගෙවනලද රු.197,916 ක මුදලද නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඉ) ප්‍රධාන ලේකම් කාර්යාලය
-----------------------------

(i) 2014 අගෝස්තු 30 දින 2015 අයවැය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ මුළුවක් රු.112,123 ක් වැයකර වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානයේ පවත්වා තිබියදී දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් එකී අරමුණ වෙනුවෙන් තවත් වැඩමුළුවක් පැවැත්වීම සඳහා 2014 නොවැම්බර් 25 දින රු.654,500 ක් හෝටලයකට ගෙවා තිබුණි. මෙම වැඩ මුළුවට සහභාගි වූ නිලධාරින් 200 ක් සඳහා අදාල වියදම දරා ඇතත්, එකී නිලධාරීන් කවුරුන්ද යන්න හෝ වැඩ මුළුවට අදාල වැඩ සටහන කුමක්ද යන්න හෝ සම්පත්දායකයින් කවුරුන්ද යන්න පිළිබඳ දත්ත කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි. එසේම මෙකී වැඩමුළුව සඳහා 2014 නොවැම්බර් 24 රු.200,000 ක අත්තිකාරමක් ගෙවා ඇතත් අවසාන ගෙවීමට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්පත්‍රයේ අත්තිකාරම් මුදලක් ලැබුණු බවක් සඳහන් නොවීය.

(ii) ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් අතිගරු ජනාධිපතිතුමාගේ දෙවන පදවිප්‍රාප්තියේ සිව්වන වසර සැමරීම වෙනුවෙන් සුභ පැතීම සඳහා පුවත්පත් දැන්වීමක් වෙනුවෙන් ආයතන 02 ක් සඳහා රු.828,800 ක් ගෙවා තිබූ අතර මෙම ගෙවීම අරමුණෙන් බැහැරව කරන ලද නිෂ්ඵල වියදමක් ලෙස විගණනයේදි නිරීක්ෂණය කෙරේ.

(ඊ) ප්‍රධාන අමාත්‍ය කාර්යාලය
------------------------------

(i) ප්‍රධාන අමාත්‍යාංශයේ අරමුණු වලට පටහැනි වූ පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 4,348,000 ක් 2014 වර්ෂයේදී වැය කර තිබුණි.

| ව්‍යාපෘතිය | වටිනාකම |
| --- | --- |
| ----------- | ------------ |
| | රු. |
| දක්ෂිණ ලිත් 150,000 ක් මුද්‍රණය කිරීම | 1,942,500 |
| ලිත් 17,500 ක් තැපැල් කිරීම | 437,500 |
| ළමුන් 400,000 ක් සඳහා කාල සටහන් 800,000 ක් මුද්‍රණය කිරීම | 1,968,000 |
| | ------------- |
| | 4,348,000 |
| | ======= |

(ii) ප්‍රධාන අමාත්‍යාංශය සතුව සංචිත වාහන 13 ක් තිබියදී දක්ෂිණ ජීවනි පාසල් දැනුම මිනුම තරඟාවලිය සඳහා මිලදී ගත් ප්‍රශ්නපත්‍ර ගෙන්වා ගැනීමට රු.50,000 ක් ප්‍රවාහන ගාස්තු ලෙස බාහිර ආයතනයක් වෙත ගෙවා තිබුණි.

## 6.9 හඳුනා ගන්නා ලද පාඩු
-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පහත සඳහන් ආයතන දෙකෙහි සේවය කර විශ්‍රාම ගිය සේවකයින් 186 දෙනෙකුගෙන් අයවිය යුතු රු.11,682,240 ක මුදලක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

| ආයතනය | සේවකයින් ගණන | මුදල |
| --- | --- | --- |
| ----------- | ------------- | ------ |
| | | රු. |
| දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 158 | 11,234,867 |
| දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 28 | 447,373 |
| | ----- | ------------- |
| | 186 | 11,682,240 |
| | === | ======== |

(ආ) රුහුණු සංචාරක කාර්යාංශය
-----------------------------------

(i) දෙනියාය සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම
---------------------------------------------------------

- මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් මිලගණන් ඉදිරිපත් කිරීමේදී ලබාදීමට කොන්ත්‍රාත්කරු එකඟවී තිබුණු රු.137,007 ක වට්ටම් මුදල අඩුකිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි.

- කානුවේ බැම්ම කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ඝන මීටර 0.804 ක ප්‍රමාණයක්වැඩිපුර මිනුම් ලබාගෙන රු.12,060 ක් ගෙවා තිබුණි.

(ii) කාර්යාංශයේ මදුනාගල උණුදිය උල්පත් ව්‍යාපෘතියට අදාල වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීමේදී ඇස්තමේන්තු ප්‍රකාරව ගෙවීම් කර තිබූ නමුත් අමතර වැඩ ලෙස රු.35,244 ක මුදලක් නැවතත් මිනුම් වාර්තාවල ඇතුළත් කර ගෙවීම් කර තිබුණි. මිට අමතරව මින්මැදුර නවීකරණය කිරීම යටතේ මාළු ටැංකි ආවරණ 04 ඉදිකර නොතිබියදී ඒ වෙනුවෙන් රු.14,000 ක් ගෙවා තිබුණි.

(ඈ) කාර්මික සංවර්ධන අධිකාරිය

--------------------------------

2015 මාර්තු 02 දින අධිකාරියට අයත් මීටියාගොඩ රතුමැටි නිෂ්පාදන මධ්‍යස්ථානය භෞතිකව පරික්ෂාවේදී 2008 වර්ෂයේ සිට 2011 දක්වා මිලදී ගන්නා ලද රු.169,067 ක් වටිනා රසායනික ද්‍රව්‍ය තොගයක් කල් ඉකුත් වී ප්‍රයෝජනයටගත නොහැකිවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) දකුණු පළාත් ධීවර, සංස්කෘතික, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදනාගාරයේ ජීවවායු ඒකකයක් ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් 21 දිනට පෙර අවසන් කළයුතු වුවද එය නිම කර භාර දී තිබුණේ 2015 පෙබරවාරි මාසයේදීය. නමුත් අදාල ව්‍යාපෘතිය අවසන් කිරීමට ප්‍රථම 2014 පෙබරවාරි 21 දින කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවා තිබූ හෙයින් රු. 92,062ක ප්‍රමාද දඩ මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

----------------------------------------------------

ගාල්ල, මාතර, හම්බන්තොට දිවිනැගුම දිස්ත්‍රික් නිලධාරීන් සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් අධිකාරියෙන් කරන ලද ඉල්ලීමකට අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම ව්‍යාපෘතිය මගින් 2014 සැප්තැම්බර් 05 සිට 07 දක්වා බිබිල ප්‍රදේශයේ පැවති පුහුණු වැඩ මුළුවක් සඳහා නිලධාරීන් ප්‍රවාහනය කිරීම සඳහා පෞද්ගලික බස් රථ 28 ක් වෙනුවෙන් අධිකාරිය විසින් රු.1,304,500 ක් බස්රථ හිමියන් වෙත ගෙවා තිබුණි. එම මුදලින් රු.464,500 ක් 2015 මාර්තු මාසයේ විගණන අවස්ථාව දක්වා ප්‍රතිපූර්ණය වී නොතිබුණ අතර මෙම මුදලප්‍රතිපූර්ණය කරන ලෙස ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇතත් 2015 ඔක්තෝබර් 15 දක්වා එකී මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඊ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

--------------------------------------------

(i) අධිකාරියේ කැබ් රථයක් 2013 මාර්තු 18 දින දික්වැල්ල ප්‍රදේශයේදී අනතුරට ලක්ව තිබූ අතර මෙම රථයේ අළුත්වැඩියාව සිදුකිරීම සඳහා අධිකාරිය විසින් රු.182,458 ක් ගෙවා තිබුණත් 2013 සැප්තැම්බර් 05 දින එම අනතුර වෙනුවෙන් රක්ෂණ සමාගම ගෙවා තිබුණේ රු.159,470 ක් පමණි. ඒ අනුව අධිකාරිය වෙත රු.22,988 ක අලාභයක් සිදුවී තිබූ අතර මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අලාභය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2015 දැයට කිරුළ පිවිසුම් මාර්ග වැඩිදියුණු කිරීම යටතේ කැකණදුර , රත්මලේ, දික්වැල්ල මාර්ගය සඳහා යොදවන ලද අංක SPZA- 2276 දරන ජේ සී බී යන්ත්‍රයේ 2014 ඔක්තෝබර් 25 සිට 29 දක්වාවූ දින 5 හි ධාවන සටහන් තොරතුරු අසත්‍ය බව විගණනයේදී අනාවරණය විය. ඒ අනුව එම දින 05 වෙනුවෙන් යන්ත්‍රය සඳහා ගෙවන ලද රු.60,690 අධිකාරියට වූ අලාභයක් ලෙස විගණනයට නිරීක්ෂණය විය.

(iii) අධිකාරිය යටතේ ක්‍රියාත්මකවූ පළාත් මාර්ග හා නිම නොවූ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මාතර ) යටතේ සංවර්ධනය සිදුකරන ලද මාර්ග කිහිපයක් වෙනුවෙන් ඒ බී සී මීටර් කියුබ් 01ක් රු.2,729 කට සැපයීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත

කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම කොන්ත්‍රාත්කරු විසින් 2011 නොවැම්බර් 07 සිට 09 දක්වා සපයන ලද කියුබ් 275.6 ක් සඳහා අංක 3891 දරන ඉන්වොයිසිය ඉදිරිපත් කර තිබූ අතර ඊට අදාල බිල්පත පරීක්ෂා කිරීම නිර්දේශ කිරීම හා අනුමත කිරීමසිදුකර තිබුණි. ඒ අනුව ගෙවිය යුතු මුදල රු.886,957 ක් වී තිබූ නමුත් එම ප්‍රමාණය සඳහා මීටර් කියුබ් 01 කට රු.4,000 බැගින් පසුව ඉදිරිපත් කරන ලද බිල්පත්‍රයක් මත 2012 මැයි 25 දින රු.1,237,376 ක් වෙනත් ආයතනයක් වෙත සාවද්‍ය ලෙසගෙවා තිබුණි. ඒ අනුව අධිකාරියට රු.350,419 ක පාඩුවක් සිදුවී තිබුණි.

(උ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් 2013 අප්‍රේල් 17 දින මිලදී ගෙන හිටපු සභාපතිවරයා වෙත ලබාදී තිබුණු රු.23,200 ක් වටිනා ජංගම දූරකථනය අධිකාරියෙන් ඉවත් වීමේදී නැවත භාර දීමට කටයුතු කර නොතිබුණි.

**6.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**----------------------------------------**

**දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

**----------------------------------------------------**

2014 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සූරියවැව බස්නැවතුම්පල කාණු පද්ධතිය අළුත්වැඩියාව සඳහා රු.159,222 ක් සූරියවැව ප්‍රාදේශීය සභාව වෙත ගෙවා තිබුණි. ඇස්තමේන්තු වැඩ විෂය යටතේ කොන්ක්‍රීට් කාණු ආවරණ සැකසීමේදී සැලසුමට අනුව යෙදිය යුතු මිලි මීටර් 450 ක්දිග මිලි මීටර් 10 කම්බි දෙකක් අඩුවෙන් යොදා එවැනි කොන්ක්‍රීට් ආවරණ 91 ක් ඉදිකර තිබුණි. ඒ අනුව සවිකර ඇති කොන්ක්‍රීට් ආවරණවල නියමිත ප්‍රමිතිය නොමැති බව නිරීක්ෂණය විය.

(ii) අම්බලන්ගොඩ බස් නැවතුම්පල අංගනය තාර දමා අළුත්වැඩියා කිරීම සඳහා අම්බලන්ගොඩ නගර සභාව වෙත රු.330,614 ක් වූ ඇස්තමේන්තු වටිනාකමට අදාල කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.1 ප්‍රකාරව මේ සඳහා කිසිදු ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබූ අතර ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.149,929 ක් වැඩියෙන් ගෙවා ඇති බව භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(iii) ඌරගස්මංහන්දිය බස් නැවතුම්පල අළුත්වැඩියා කිරීමේදී පලමු තාර ආලේප යෙදීමට අදාල මිනුම් වාර්තාවල වර්ග මීටර් 265.94 ක් වැඩිපුර දක්වා ඒ වෙනුවෙන් රු.90,154 ක් කොන්ත්‍රාත් සමිතිය වෙත ගෙවා තිබුණි.

(iv) උඩුවිල බස් නැවතුම්පල අළුත්වැඩියා කිරීමේදී ඇස්තමේන්තු වැඩ විෂය අංක 04 යටතේ බිත්තිවල කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන තීන්ත දෙවරක් ආලේප කිරීම සඳහා වර්ග මීටර් 188.92 කට රු.53,464 ක් ගෙවා තිබුණද තීන්ත එක්වරක් පමණක් ආලේප කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**6.11 ප්‍රමාද වූ ව්‍යාපෘති**

**-----------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය

-----------------------------------------

2013 වර්ෂයේ වටිනාකම රු.145,000 ක් වූ මන්ත්‍රී ප්‍රතිපාදන ලැබීම්වලින් ව්‍යාපෘති 03 ක්ද 2014 වර්ෂයේ වටිනාකම රු.139,050 ක් වූ මන්ත්‍රී ප්‍රතිපාදන ලැබීම් වලින් ව්‍යාපෘති 05 ක්ද ආරම්භ කර තිබුණු අතර, 2014 වර්ෂයේ දෙසැම්බර් 03 දිනවන විටත් එම ව්‍යාපෘති අවසන් කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය

ප්‍රධාන අමාත්‍ය, මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරන ලද සෞඛ්‍ය සංවර්ධන සැලැස්මට අදාල ව්‍යාපෘති 2014 වර්ෂය තුළම ක්‍රියාත්මක කර අවසන් කළයුතු බව සඳහන් වුවද, රු.4,301,289 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ ව්‍යාපෘති 12 ක් 2014 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) රුහුණු සංචාරක කාර්යාංශය

(i) පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ යෝජිත ඇස්තමේන්තු වටිනාකම රු.500,000 ක්වූ ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි.

(ii) පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2014 දෙසැම්බර් 31 දිනට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| තොරතුරු පද්ධතියක් සකස් කිරීම | 4,490,000 | 2013.12.23 | 898,000 | මෙම ව්‍යාපෘතිය ඉතා සංකීර්ණ හා වියදම් අධික කාර්යයක් ලෙස හඳුනාගැනීම |
| අම්බලන්ගොඩ තානායම ඉදිකිරිම | - | 2012.07.28 | 5,365,072 | ප්‍රමාණවත් මුදල් නොලැබීම |

(ඈ) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

විධිමත්ඇස්තමේන්තුවක්හානිසිසැලසුමක්රහිතවප්‍රතිපාදනවෙන්කරගැනීමහේතුවෙන්2014 පළාත්නිශ්චිතසංවර්ධනප්‍රදානයටතේදෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති දෙකක් සඳහා ලබා දී තිබුණු රු.800,000ක ප්‍රතිපාදනයෙන් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර රු.716,502 ක් ඉතිරි වී තිබුණි.

(ඉ) සමාජ සේවා අරමුදල

දකුණු පළාත් සභාවේ 2002 අංක 02 දරන සමාජ සේවා ප්‍රඥප්තියේ 2 වගන්තියට අනුව සමාජ සේවා අරමුදලේ මූලික පරමාර්ථය වනුයේ දකුණු පළාත තුළ පදිංචි දිළිඳු, අසරණ ආබාධිත තැනැත්තන් වෙනුවෙන් රෝගාධාර, ශිෂ්‍යාධාර සහ නිවාසාධාර සැපයීම වේ. මෙම අරමුණු කරා ළඟාවීම සඳහා සමාලෝචිත වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් ලැබී තිබුණු රු.11,741,050 ක මුදලින් සියයට 22 ක් වූ රු.2,548,071 ක යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඊ)** ක්‍රීඩා, යෞවන කටයුතු ,ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන,සංචාරක, ආර්ථික ප්‍රවර්ධන, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, වනිතා කටයුතු , නිවාස හා ඉදිකිරීම් සහ මිනිස්බල හා රැකි රක්ෂා අමාත්‍යාංශය

බද්දේගම ක්‍රීඩාසංවර්ධන මධ්‍යස්ථානයෙහි මීටර් 400 ධාවන පථය ඉදිකිරීම 2001 වර්ෂයේ ආරම්භ කළද 2014 දෙසැම්බර් 31 වන විටත් අවසාන වී නොමැති බව නිරීක්ෂණය විය. 2012 වර්ෂයේ ප්‍රතිපාදන වලින් රු.45,319,030 ක් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතියෙන් පොදු තැන්පත්

ගිණුමට මාරුකර තිබුණු අතර එම මාරුකළ ප්‍රතිපාදනවලින් රු.22,290,235 ක් හෙවත් සියයට 49ක් 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී ඇති බව නිරීක්ෂණය විය.

(උ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) කාර්යාලය

---

(i) පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම

---

- 2014 වර්ෂයේ විසර්ජන ගිණුම් අනුව වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වූ වියදම රු.1,313,801,216 ක් වූ අතර විගණනය වෙත ඉදිරිපත් කරන ලද 2014 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වූ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ වාර්තා අනුව එකී වියදම රු.794,739,379 ක් විය. මේ අනුව රු.519,061,837 ක ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ප්‍රගති වාර්තාවට ඇතුළත් වී නොතිබුණි.

- 2014 වර්ෂයේ නව වැඩ සඳහා රු.548,024,856 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර වර්ෂය තුළ මෙම ප්‍රතිපාදනවලින් වැයකිරීම් රු.256,140,622 ක් හෙවත් සියයට 46.74 ක් පමණක් විය.

- 2014 වර්ෂයේ අවිච්ඡේද වැඩ සඳහා වෙන් කරන ලද රු.772,536,591 ක් වූ ප්‍රතිපාදනවලින් වර්ෂය තුළ වැයකර තිබුණේ රු.538,598,757 හෙවත් ප්‍රතිපාදිත මුදලින් සියයට 70 ක් පමණි.

- සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු සමස්ථ ව්‍යාපෘති ප්‍රමාණය 1198 ක් විය. ඒ වෙනුවෙන් ප්‍රතිපාදිත මුදල රු.1,320,561,447 ක් වූ අතර 2014 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණේ රු.794,739,379 ක් හෙවත් ප්‍රතිපාදිත මුදලින් සියයට 60 ක් පමණි. 2014 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ නව වැඩ ව්‍යාපෘති 660 කින් 2014 දෙසැම්බර් 31 වන විට නිම කර තිබුණේ ව්‍යාපෘති 531 ක් හෙවත් මුළු ව්‍යාපෘතිවලින් සියයට 80 ක් පමණි. තවද 2014 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබූ අවිච්ඡේද වැඩ ව්‍යාපෘති 538 කින් 2014 දෙසැම්බර් 3 වන විට නිමකර තිබුණේ ව්‍යාපෘති 478 ක් හෙවත් මුළු ව්‍යාපෘතිවලින් සියයට 89 ක් පමණි.

- විකල්ප බලශක්ති යටතේ නව වැඩ සඳහා ව්‍යාපෘති 6 ක් වෙනුවෙන් අනුමත මුළු ප්‍රතිපාදිත මුදල වන රු.6,756,600 ක් 2014 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණයෙන් වැය කර ඇතත් එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 51 ත් 75 ත් අතර පැවතුණි.

(ii) උපමාන පාදක සංවර්ධන සැලැස්ම

---

- දකුණු පළාතේ උපමාන පාදක සංවර්ධන සැලැස්ම යටතේ 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත නව වැඩ සඳහා අනුමත මුදල රු.195,561,359 ක් වූ අතර වර්ෂයේ වියදම රු.119,750,184 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 61.23 ක් විය.

- වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති ගණන 302 ක් වූ අතර, වර්ෂය අවසානයට වැඩ නිමකර තිබුණේ ව්‍යාපෘති 174 ක් හෙවත් මුළු ව්‍යාපෘතිවලින් සියයට 57.62 ක් පමණි. දෙසැම්බර් 31 දිනට වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති ගණන 81 ක් වූ අතර එය සියයට 26.82 ක් විය.

- 2014 නව ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශ 5 අතර ප්‍රතිපාදන බෙදී යෑම හා වියදම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශයේ නම | වෙන්කළ ප්‍රතිපාදනය | සමුච්චිත වියදම | ප්‍රතිශතය | |
|---|---|---|---|---|
| | | | මුළු ප්‍රතිපාදන-යෙන් | ප්‍රතිපාදනයට සාපේක්ෂව වියදම |
| | රු. | රු. | - | |
| 1. ප්‍රධාන අමාත්‍ය , මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශය | 84,947,696 | 28,080,382 | 43.43 | 33.06 |
| 2. ධීවර ,සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු , ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | 41,555,060 | 37,312,167 | 21.25 | 89.79 |
| 3. ක්‍රීඩා, යෞවන කටයුතු , ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආර්ථික ප්‍රවර්ධන, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා වනිතා කටයුතු , නිවාස හා ඉදිකිරීම් සහ මිනිස්බල හා රැකි රක්ෂා අමාත්‍යාංශය | 34,371,820 | 24,249,009 | 17.58 | 70.55 |
| 4. කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන , ආහාර සැපයුම් හා බෙදාහැරීම් , වෙළඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය | 21,894,783 | 21,627,985 | 11.20 | 98.78 |
| 5. අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන , මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 12,792,000 | 8,480,641 | 6.54 | 66.30 |
| | 195,561,359 | 119,750,184 | 100 | 61.23 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

- ප්‍රධාන අමාත්‍යාංශය යටතේ වූ ප්‍රතිපාදනයෙන් රු.30,000,000 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 35.32 ක් දකුණු පළාත් සංවර්ධන අධිකාරිය යටතේ වෙන්කර තිබූ නමුත් එකී මුදලින් වර්ෂය තුළ වැයකර තිබුණේ රු.8,050,579 ක් හෙවත් සියයට 26.84 ක් පමණි. එසේම වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 96 න් වර්ෂය තුළ වැඩ නිමකර තිබුණේ ව්‍යාපෘති 16 ක් හෙවත් සියයට 16.67 ක් පමණි. ව්‍යාපෘති 70 ක් හෙවත් මුළු ව්‍යාපෘතිවලින් සියයට 72.92 ක වැඩ 2014 දෙසැම්බර් 31 දින දක්වාත් ආරම්භ කර නොතිබුණි.

- 2014 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති 57 ක් සඳහා රු.50,663,997 ක් වෙන්කර තිබුණු අතර, වර්ෂය තුළ ඉන් වැයකර තිබුණේ රු.39,484,993 ක් හෙවත් සියයට 77.94 ක් පමණි. එසේම වර්ෂය තුළ ප්‍රතිපාදිත මුදලින් රු.38,320,838 ක් හෙවත් සියයට 75.64 ක් වෙන්කර තිබුණේ ප්‍රධාන අමාත්‍ය, මුදල්හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශය සඳහාය.

- දකුණු පළාත් සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත බොහෝ ව්‍යාපෘති පළාත් සභාව තුළ ස්ථාපිත අමාත්‍යාංශයක් හෝ වෙනත් ආයතනයක් (දෙපාර්තමේන්තුවක්/

අධිකාරියක්) යටතට වැටෙන ව්‍යාපෘති බව නිරීක්ෂණය විය. අදාල විෂයය සඳහා විශේෂිත දැනුම ඇති මානව සම්පත් හා අනිකුත් සම්පත් සහිත ආයතන තිබියදී විෂයය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නැති නිලධාරීන් සහිත හා අවශ්‍ය මානව සම්පත් රහිත දකුණු පළාත් සංවර්ධන අධිකාරිය වෙත එවැනි ව්‍යාපෘති පැවරීම තුළින් විවිධ අක්‍රමිකතාවයන් ඇතිවිය හැකි බව විගණනයට නිරීක්ෂණය විය.

(iii) උපමාන පාදක (මන්ත්‍රී ප්‍රතිපාදන) සැලැස්ම
------------------------------------------------

- 2014 වර්ෂය සඳහා ව්‍යාපෘති 2022 ක් වෙනුවෙන් රු.182,961,409 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර ඉන් රු.172,052,409 ක් හෙවත් අනුමත මුදලින් සියයට 94 ක් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් නිදහස් කර තිබුණි. නමුත් වර්ෂය තුළ වැය කර තිබුණේ ඉන් රු.88,281,531 ක් හෙවත් නිදහස් කළ මුදලින් සියයට 51 ක් පමණි. මේ අනුව 2014 දෙසැම්බර් 31 දිනට රු.83,770,878 ක මුදලක් විවිධ ආයතනවල ඉතිරිව පැවතුණි.

- ප්‍රගති වාර්තා අනුව වර්ෂයට අනුමත ව්‍යාපෘති 2022 න් වර්ෂය තුළ නිමකර තිබුණේ ව්‍යාපෘති 1048 ක් පමණි. මෙය මුළු ව්‍යාපෘතිවලින් සියයට 51.83 ක් පමණක් විය. ව්‍යාපෘති 250 ක වැඩ වර්ෂය තුළ ආරම්භ කර නොතිබූ අතර එය සියයට 12.36 ක් විය.

- වියදම් දැරීම සඳහා මුදල් අවශ්‍යවන කාලය පිළිබඳව පුරෝකථනයකින් තොරව ව්‍යාපෘති අනුමත වීමත් සමඟ මුදල් නිදහස් කිරීම තුළින් වර්ෂය අවසානයට විශාල මුදලක් විවිධ ආයතන තුළ රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. එසේම මුදල් වැය විෂයන්ට හරකර ලබාදෙන බැවින් ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘතිවලට අදාල මුදල්ද වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත වීම තුළින් විසර්ජන ගිණුම් මගින් පෙන්වන තත්ත්වය නිවැරදි නොවන බවද නිරීක්ෂණය විය. මේ ආකාරයට 2011 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ විවිධ ව්‍යාපෘති සඳහා දකුණු පළාත් සංවර්ධන අධිකාරිය වෙත මුදාහරින ලද මුදල්වලින් රු.31,043,123 ක් 2015 ජූනි 15 වන විටත් අදාල ව්‍යාපෘති සඳහා භාවිතා නොකර අධිකාරියේ රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

- දකුණු පළාත් සංවර්ධන අධිකාරිය වෙත ලබාදී ඇති රු.31,043,123 ක ව්‍යාපෘති තුළ ඇතුළත් සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති වූ අතර සමහර ව්‍යාපෘති සඳහා යෝජනා ලැබී නොතිබූ බව නිරීක්ෂණය විය. තවත් සමහර ව්‍යාපෘතිවල වැඩ අරඹා නොතිබූ බවත් සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අධිකාරිය වෙත ලැබී නොතිබූ බවත් නිරීක්ෂණය විය.

  මේ පිළිබඳ විස්තර පහත සටහනින් දක්වා ඇත.

| විස්තරය | ව්‍යාපෘති ගණන | මුදල |
|---|---|---|
| | | රු. |
| ක්‍රියාත්මක නොවන | 20 | 4,959,500 |
| වැඩ අරඹා නැති | 08 | 1,440,000 |
| ක්‍රියාත්මක කිරීමට අදාල තොරතුරු ලැබී නැති | 15 | 2,211,715 |
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පසු ඉතිරි මුදල් | 07 | 193,807 |
| වැඩ යෝජනා ලැබී නැති | 07 | 1,539,730 |
| | | 10,344,752 |

**6.12 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් /දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

කාර්මික සංවර්ධන අධිකාරිය රු. 6,705,600 ක ඇස්තමේන්තු වටිනාකමක් යටතේ සංචාරක නිකේතනයන් ආරම්භ කිරීම සඳහා වූ ව්‍යාපෘතිය වෙනුවෙන් යොදා ගනු ලබන බෝගහපැලැස්ස ජේෂකර්ම මධ්‍යස්ථානයට අයත් ඉඩම හා ගොඩනැගිලිවල අයිතිය කාර්මික සංවර්ධන අධිකාරිය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමකින් තොරව ව්‍යාපෘති කටයුතු ආරම්භ කර තිබුණි.

**6.13 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් සම්පත්/බාහිර පුද්ගලයින්ට අයත් සම්පත්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාතර දිස්ත්‍රික්කයේ මහා විද්‍යාලයක ගුරු මණ්ඩලයේ ගුරුවරුන් 08 දෙනෙකු පාසලෙන් වැටුප් ලබමින් වෙනත් පාසල්වල සහ කලාප අධ්‍යාපන කාර්යාලවල සේවය සඳහා පූර්ණකාලීනව නිදහස් කර තිබුණි.

(ආ) දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහන දෙකක් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට හා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ලබාදී තිබුණි.

6.14 කාර්යමණ්ඩලපරිපාලනය

6.14.1 දකුණු පළාත් අධ්‍යාපන සේවාව

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් අධ්‍යාපන සේවාවට අයත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය තුලනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් දකුණු පළාත තුළ වූ පළාත් සභා පාසල් 1050 කින් පාසල් 516 ක ගුරුවරුන් 2224 ක අතිරික්තයක්ද පාසල් 412 ක ගුරුවරුන් 1842 ක ඌනතාවයක්ද පැවතුණි. ගාල්ල කලාප කාර්යාලයට අදාලව එක් එක් පාසල් වශයෙන් අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර එම කාලාපය හැර අනෙකුත් කලාපවලඅනධ්‍යයන කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇති පාසල් 576 කින්,පාසල් 178 ක සේවකයින් 288 ක අතිරික්තයක්ද පාසල් 277 ක සේවකයින් 548 ක ඌනතාවයක්ද පැවතුණි.

(ආ) දකුණු පළාත් අධ්‍යාපන සේවාව තුළ වාර්ෂිකව ස්ථාන මාරුකිරීම් විධිමත් පරිදි සිදු නොකර නිලධාරීන්ගේ ඉල්ලීම මත තාවකාලිකව අනුයුක්ත කිරීම් විශාල ලෙස සිදුකර තිබුණි. මෙමගින් ස්ථිර සේවා ස්ථානයේ නිලධාරීන් ඌනතාවයද අනුයුක්ත කළ ආයතනවල අතිරික්තයද නිරූපණය නොවන අතර මෙම තත්ත්වය දකුණු පළාත් අධ්‍යාපන සේවාවේ ගුණාත්මක වර්ධනය සඳහා අහිතකර බව නිරීක්ෂණය විය.

(ඇ) දකුණු පළාත් අධ්‍යාපන සේවාවට අයත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 24 දෙනෙකු 2014 වර්ෂයේ දින 1560 ක් වැටුප් රහිත නිවාඩු ලෙස ලබාගෙන තිබුණි. මෙම නිලධාරීන් සෑම වර්ෂයකදීම පුරුද්දක් වශයෙන් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති බව නිරීක්ෂණයවිය.

(ඈ) දකුණු පළාත් අධ්‍යාපන සේවයේ විවිධ තනතුරු වලට බඳවා ගත් පුද්ගලයින් 12 දෙනෙකු දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග, ප්‍රවෘත්ති අමාත්‍යවරයා වෙත මුදා හැර තිබුණි. මොවුන්ගේ වැටුප් වෙනුවෙන් 2014 වර්ෂය තුළ රු.2,665,624 ක් දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් දරා තිබුණි.

(ඉ) මාතර දිස්ත්‍රික්කයේ මහා විද්‍යාලයක උප ගුරුවරයෙකු 2014 අප්‍රේල් 21 සිට දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබු අතර 2014 වර්ෂය තුළදී ඔහුට රු.198,442 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඊ) දකුණු පළාත් අධ්‍යාපන සේවාවට අයත් නිලධාරීන් තිදෙනෙකු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය සඳහා මුදාහැර දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය සඳහා ඔවුන්ගේ වැටුප් ලෙස රු.1,288,056ක් ගෙවා තිබුණි.

(උ) දකුණු පළාත් අධ්‍යාපන සේවාවට අයත් ගුරුවරුන් 4 දෙනෙකු විවිධ ආයතන වෙත මුදාහැර ඔවුන්ගේ වැටුප් ලෙස 2014 වර්ෂයේදී පමණක් රු.1,447,800 ක් දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ගෙවා තිබුණි. මීට අමතරව දකුණු පළාත් අධ්‍යාපන සේවාවට අයත් ගුරුවරු 18 ක් ජාතික ශිෂ්‍යභට බලකායට/ ආරක්ෂක හමුදාවන්ට මුදාහැර තිබුණු අතර මොවුන්ගේ වැටුප් ලෙස රු.6,285,386 ක් 2014 වර්ෂය තුළදී දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් දරා තිබුණි.

(ඌ) අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලය මගින් 2014 අගෝස්තු මාසයේ සිට එක්තරා අයෙකුට වැටුප් ගෙවා ඇතත්,ඔහු බඳවාගත් දිනය, තනතුර,බඳවාගත් ආයතනය, අනුයුක්ත කළ දිනය, අනුයුක්ත කළ ආයතනයේ පැමිණීම පිටවීම අත්සන් කරතිබේද යන්න හෝ ඉටුකළ කාර්යයන් මොනවාද යන්න පිළිබඳව තොරතුරු නොදන්නා බව 2015 සැප්තැම්බර් 04 දින කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් විගණනයට වාර්තාකර තිබුණි. 2014 වර්ෂයේදී මොහුට වැටුප් වශයෙන් රු.135,210 ක් ගෙවා තිබු බව විගණනයේදී අනාවරණය විය.

### 6.14.2 දකුණු පළාත් සෞඛ්‍ය සේවාව

2014 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1069 | 766 | 303 | - |
| තෘතීයික මට්ටම | 240 | 172 | 68 | - |
| ද්විතියික මට්ටම | 4681 | 3750 | 931 | - |
| ප්‍රාථමික මට්ටම | 3068 | 2421 | 862 | 215 |
| | 9058 | 7109 | 2164 | 215 |

(i) ඉහත පුරප්පාඩු අතුරින් පුරප්පාඩු 22 ක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වන අතර, ඉන් ඉහළ මට්ටමේ තනතුරු 12 ක පුරප්පාඩු නිරීක්ෂණය විය.

(ii) ප්‍රාථමික මට්ටම සඳහා විධිමත් අනුමැතියක් රහිතව සේවකයින් 215 ක් අතිරික්තව බඳවාගෙන තිබුණි.

## 07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 ක්‍රියාකාරි සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කළ යුතු වුවත් දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2014දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි.

### 7.2 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කර නොතිබුණි.

**7.3** **නොවිසඳී ඇති විගණන ඡේද**

**------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 සැප්තැම්බර් 30 දින වන විට විගණන විමසුම් 24කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු.244,668,464 ක් විය.

(ආ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පළාත් ගිණුම් කාරක සභාව මඟින් 2014 දෙසැම්බර් 11, 12, 2015 ජනවාරි 26 , අප්‍රේල් 27 දිනවලදී ලබාදී ඇති නියෝග 08 ක් 2015 අගෝස්තු 31 දක්වාත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) දකුණු පළාත් සංවර්ධන අධිකාරියට පළාත් ගිණුම් කාරක සභාව මඟින් 2015 මාර්තු 23 හා අප්‍රේල් 07 දින ලබාදී තිබූ නියෝග 09 ක් 2015 අගෝස්තු 31 දක්වාත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**8.** **පද්ධති හා පාලනය**

**--------------------**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර දකුණු පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) සේවක පරිපාලනය

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) වාහන උපයෝජනය

(උ) තොග පාලනය

(ඌ) අරමුදල් කළමනාකරණය